# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2197/27 - 2020 ඔක්තෝබර් මස 17 වැනි සෙනසුරාදා - 2020.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### බලශක්ති අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

බලශක්ති අමාත්‍යවරයා ලෙස උදය ගම්මන්පිල වන මා විසින් රජය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

**උදය ගම්මන්පිල,**
බලශක්ති අමාත්‍ය.

2020 ඔක්තෝබර් 17 වැනි දින.

**1. හැඳින්වීම**

මන්නාරම් ද්‍රෝණියේ වාණිජමය ස්වභාවික වායු හා සංඝනීභූත සංචිත සම්බන්ධයෙන් ගවේෂණාත්මක සාක්ෂි සමග රටේ සමස්ත බලශක්ති මිශ්‍රණයේ විවිධත්වය වැඩිකිරීම පිණිස වඩා පවිත්‍ර විකල්ප ඉන්ධන පරිශීලනය ශ්‍රී ලංකාවේ ස්වභාවික වායු සඳහා උනන්දුව වැඩිකර තිබේ.

බලශක්ති ජනනය කිරීම සඳහා පමණක් නොව, වෙනත් බහුවිධ ආර්ථික අංශ සඳහා ද යොදාගත හැකි ද්‍රවීකෘත ඛනිජතෙල් හා ගල් අඟුරු වෙනුවට ස්වභාවික වායු වඩා පවිත්‍ර විකල්පයක් සලසයි. බලශක්ති ප්‍රභවයක් වීම හැර, කර්මාන්තීය හා පාරිභෝගික නිෂ්පාදන පුළුල් පරාසයක් නිෂ්පාදනයේ දී යූරියා පොහොර, මෙතනෝල්, එතනෝල් හා ෆෝර්මල්ඩිහයිඩ් වැනි රසායනික නිෂ්පාදන නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් ස්වභාවික වායු ලොව පුරා භාවිතා කෙරේ.

ආනයනය කළ ද්‍රවීකෘත ස්වභාවික වායුවලට අදාළ අතිරේක ද්‍රවීකෘතකරණය, ප්‍රවාහන හා ප්‍රතිවායුකරණ පිරිවැය දේශීය ස්වභාවික වායු යොදාගැනීම තුළින් අවම වන බැවින් දේශීය ස්වභාවික වායු ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිත භාවයට දායකවීමට ශක්තිමත් ශක්‍යතාවක් පවතී. එම නිසා, ඒවා අක්වෙරළේ තිබෙන බවට සනාථ වීම ඉල්ලුමක්, ගොඩනැගිලි පිළිවෙතක් හා ජාලිත යටිතල ව්‍යුහයක් නිර්මාණය කිරීම වෙනුවෙන් ක්‍රියාශීලී ප්‍රතිපත්ති ප්‍රවේශයක් යුක්ති යුක්ත කරයි.


1A - PG 005106 — 470 (2020/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### 1.1 පසුබිම

ප්‍රාග් ඓතිහාසික යුගයේ දී කාබනීය වශයෙන් පොහොසත් අප්‍රිකානු විවර පද්ධතිය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ පිහිටීම සැළකිල්ලට ගැනීමේ දී, ශ්‍රී ලංකාවේ කාරක ඛනිජතෙල් පද්ධති තිබීම ගැන බොහෝ කලක සිට අනුමාන කර ඇත. භූවිද්‍යාත්මකව, මන්නාරම් ද්‍රෝණියේ නිධිමය ඉතිහාසය 2010 හා 2011 වසර තුළ දී ලොව විශාලතම වායු සංචිත කීපයක් සොයාගන්නා ලද මොසැම්බික් රාජ්‍යයට සමීපවේ. එයට සමාන ඉන්ධන හා වායු නිධි ශ්‍රී ලංකාවේ තිබීමේ හව්‍යතාවය, වසර 2011 පසුභාගයේ දී කෙයාන් ඉන්දියා විසින් වයඹ වෙරළට ඔබ්බෙහි ඩොරාඩෝ සහ බැරකියුඩා වායු හා සංඝනීභූත සොයා ගැනීමෙන් සනාථ විය. නවීන ද්විමාන හා ත්‍රිමාන භූකම්පන දත්ත තෙල් ළිං හා හර දත්ත පදනම් වූ ද්‍රෝණි නිරූපිතය අනුව, ඝණ අඩි ට්‍රිලියන 2ට සමීප මූලිකව ස්ථානගත වායු ප්‍රමාණයක් තිබෙන බව ඇස්තමේන්තු කර තිබේ. මෙම සොයා ගැනීම් තුළින්, මන්නාරම් ද්‍රෝණියේ පමණක් නොව, උතුර හා නැගෙනහිර වෙනත් අක්වෙරළ ප්‍රමුඛ අවසාදිත ද්‍රෝණිවල වැඩිමනත් ගවේෂණ සිදු කිරීම සඳහා අනුබලයක් දී ඇත. තෙල් හා වායු පැවතීම සොයාගැනීම සඳහා නැගෙනහිර වෙරළට ඔබ්බෙන් පිහිටා තිබෙන අවසාදිත ද්‍රෝණියේ කොටසක් ගවේෂණය කිරීම ශ්‍රී ලංකාව දැනටමත් ආරම්භකර තිබේ. තවද, සමුද්‍ර නීති ගිවිසුම යටතේ බෙංගාල බොක්කේ අවසාදිත කොටසේ විශාල මුහුදු බිම් ප්‍රදේශයක් සඳහා ශ්‍රී ලංකාව අයැදුමක් කර ඇත. (weblink:https://www./un.org/Depts/los/clcs_-new/submissiions-_files/lka43_-09/lka2009executivesummary.pdf).

ශ්‍රී ලංකාව දේශීය වායු නිෂ්පාදනය තුළින් ෆොසිල ඉන්ධන ආනයන මත යැපීම අඩුකර ගැනීමටත්, අනාගතයේ දී ස්වභාවික වායු අපනයනකරුවෙකු බවට පත්වීමටත් අවස්ථාව සලසනු ඇත. එම නිසා, නැණවත් ලෙස කළමනාකරණය කළහොත්, ෆොසිල ඉන්ධන ආනයනය අඩුකිරීමේ දීර්ඝකාලීන හැකියාවක් පමණක් නොව," විදේශීය විනිමය උපයා ගැනීමට ද දේශීය ස්වභාවික වායු මගින් අවස්ථාව සලසයි. එසේ වුවද, වත්මන් සූදානම් තත්ත්වය සලකා බැලීමේ දී, රටේ බලශක්ති ඉල්ලුමෙන් සැලකිය යුතු කොටසක් සාක්ෂාත් කරගැනීමට හැකි, දේශීය ස්වභාවික වායු ප්‍රභවයන් සම්පූර්ණ මෙහෙයුම් පද්ධතියක් වශයෙන් විකාසය කිරීමට වසර කීපයක් ගතවිය හැකිය. එම නිසා, කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා, ආනයනය කළ හා නැවත වායුවලට හැරවූ දියර ස්වභාවික වායු මත යැපීමට සිදුවේ.

ඛනිජතෙල් හා ගල් අඟුරු බඳු වෙනත් ෆොසිල ඉන්ධන වර්ග සමග සන්සන්දනය කරන කල ස්වභාවික වායු යනු සාපේක්ෂව වඩාත් පිරිසිදු බලශක්ති මූලාශ්‍රයක් වේ. ගෑස් වඩාත් පවිත්‍ර දහනයක් සහිත වන අතර, බලශක්ති ඒකකයක් ජනනය කිරීමේ දී ඛනිජතෙල් දහනයට වඩා 25%ක් පමණ අඩු අගයකින් යුත් හා ගල් අඟුරු දහනයට වඩා 40%කින් අඩු මට්ටමේ කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයක් මුදා හරී. එබැවින්, බලශක්ති සුරක්ෂිතතාව ඉහළ නංවනවාට අමතරව, ස්වභාවික වායු බලශක්ති භාවිතය ආශ්‍රිත පාරිසරික ගැටළු අවම කිරීමට ද උපකාරී විය හැකිය. කාලගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමේ ජාතික වශයෙන් තීරණය කරගත් දකයත්වයත් හා අනුගතව, දෙන ලද කාල රාමුවක් තුළ නිශ්චිත ප්‍රමාණයන්ගෙන් කාබන් විමෝචනයන් අවම කිරීමට වූ සිය කැපවීම ශ්‍රී ලංකාව විසින් 2016 වසරේ දී ස්වේච්ඡාවෙන්ම ප්‍රකාශයට පත් කරන ලදී. ස්වභාවික වායු කරා විතැන් වීම මගින් කාලගුණික විපර්යාස සමනය කිරීම උදෙසා වූ ජාතික කැපවීම සාක්ෂාත් කරගනු පිණිස උපකාරී වෙමින් කාබන් විමෝචනයන් අවම කිරීමේ ඵලදායී මඟක් සම්පාදනය කරනු ලබයි. තවද, ස්වභාවික වායු කරා විතැන් වීම හේතුකොට සල්ෆර් ඔක්සයිඩ් හා අංශු උත්පාදනය ශූන්‍ය මට්ටමේ පැවරීම හා නයිට්‍රජන් ඔක්සයිඩ් හා කාබන් මොනොක්සයිඩ් උත්පාදනය අවම වීම මගින් වායු දූෂණය ආශ්‍රිත සෞඛ්‍ය අවදානම් ද දිගු කාලයේදී අවම කිරීමට දායකත්වයක් ලැබෙනු ඇත.

ධනාත්මක අපේක්ෂා තිබුණද, ස්වභාවික වායු ගැන කිසිම ආර්ථික අංශයක පූර්ව පළපුරුද්දක් ශ්‍රී ලංකාවට නොමැත. සමීපම අත්දැකීම වී ඇත්තේ ද්‍රවීකෘත ඛනිජතෙල් වායු ගෘහස්තව හා කර්මාන්තීය භාවිතය පිළිබඳවය. බොහෝ ප්‍රජාවන් අතර, ගෘහස්ථ අංශයේ ඉවුම් පිහුම් සඳහා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු ප්‍රධාන බලශක්ති ප්‍රභවය වී තිබෙන අතර, කර්මාන්තීය තාප ජනනය සඳහා යොදා ගැනීම වැනි වෙනත් අංශවල එහි භාවිතය සෙමින් වැඩිවී තිබුණද, ප්‍රවාහන අංශයේ ප්‍රගතියක් පෙනීමට නොමැත. වසර කීපයකට පෙර, ද්‍රවීකෘත ඛනිජතෙල් වායු වලින් ධාවනය කළ වාහන ශ්‍රී ලංකාවේ තිබුණ මුත්, පරිශීලකයින් හා සැපයුම්කරුවන් දෙපාර්ශවයටම දුර්වල ආර්ථික ප්‍රතිඵලයක් ලැබෙන ප්‍රධාන වශයෙන් ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා, නොසැලකිය යුතු සංඛ්‍යාවක් දක්වා පහළ බැස ඇත. ද්‍රවීකෘත ඛනිජතෙල් වායු ප්‍රධාන වශයෙන් ආනයනය කරනු ලබන අතර, කැළනියේ, සපුගස්කන්දේ පිහිටි එකම දේශීය පිරිපහදුව මගින් අතුරු නිෂ්පාදනයක් ලෙස දේශීය වශයෙන් කුඩා ප්‍රමාණයක් සපයනු ලබයි. ශ්‍රී ලංකාවේ පසුගාමී ඛනිජතෙල් කර්මාන්තය ප්‍රධාන ලෙස කේන්ද්‍රීය වී ඇත්තේ ප්‍රවාහනය සඳහා ද්‍රවීකෘත ඉන්ධන (එනම්, පෙට්‍රල් හා ඔටෝ ඩීසල්), කර්මාන්ත සඳහා දැවි තෙල් හා ගෘහස්ත, ධීවර හා වෙනත් සැහැල්ලු කර්මාන්තවල භාවිතය සඳහා භූමිතෙල් බෙදාහැරීම සම්බන්ධයෙනි. ඛනිජතෙල් සැපයුම (අ) ආනයනය කරන ලද බොර තෙල් පිරිපහදු කිරීම (දළ වශයෙන් 35%) හා (ආ) පිරිපහදු කළ නිෂ්පාදන ඍජු ආනයනය (දළ වශයෙන් 65%) වශයෙන් සමන්විත වේ. ඉල්ලුම දේශීය පිරිපහදුවේ ධාරිතාවය අභිභවනය කළ 1990 ගණන්වල මැද භාගයේ සිට දේශීය ඉන්ධන තෙල් අලෙවියේ ප්‍රමුඛ කොටසක් වූයේ ආනයනය කළ නිෂ්පාදනය.

ස්ථාපිත පසුගාමී ඛනිජතෙල් හා ද්‍රවීකෘත ඛනිජතෙල් වායු කර්මාන්තයෙහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වන විට ශ්‍රී ලංකාවට ඛනිජතෙල් සම්බන්ධ නෛතික හා ආයතනික ක්‍රියාරාමුවක් පවතී. වර්තමානයේ දී පහත පරිදි ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් අංශය පාලනය කරනු ලබන අණපනත් හතරක් වේ.

- 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත (1963 හා 1965 දී සංශෝධිත).

- ශ්‍රී ලංකාව තුළ ඛනිජතෙල් ගවේෂණය හා සොයාගැනීම සඳහා විධිවිධාන සලසනු පිණිස වූ 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත.

- ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය, අපනයනය, අලෙවිය, සැපයීම හා බෙදාහැරීම සම්බන්ධ විකල්ප කාර්ය පටිපාටියක් සඳහා විධිවිධාන සලසනු පිණිස වූ 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත.

- උපයෝගිතා කර්මාන්තවලට අදාළ බලපත්‍ර දීමේ, නිගමනය කිරීමේ හා පරීක්ෂා කිරීමේ කාර්යයන් ඉටුකිරීමට අදාළ විධිවිධාන සලසනු පිණිස 2002 අංක 35 දරන ශ්‍රී ලංකාවේ මහජන උපයෝගීතා කොමිසම (විශේෂ විධිවිධාන) පනත.

  මෙම අණපනත් ක්‍රියාත්මක කිරීමේ වගකීම් රාජ්‍ය ආයතන කීපයකට පවරා තිබේ. ඒවා අතර, ප්‍රධාන ආයතන පහත දැක්වේ :

- ඛනිජතෙල් විෂයභාර අමාත්‍යාංශය (මින් ඉදිරියට අමාත්‍යාංශය වශයෙන් සඳහන් වන)

- ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව යනු, ඛනිජතෙල් පිරිපහදු කිරීමේ ක්ෂේත්‍ර ආවරණය කරමින් ඛනිජතෙල් ආනයනකරුවෙකු, අපනයනකරුවෙකු, අලෙවිකරුවෙකු, සැපයුම්කරුවෙකු හෝ බෙදාහරින්නෙකු වශයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යෑම සඳහා විධිනියෝගයක් සහිතව ස්ථාපිත කර තිබෙන රජයට අයත් ව්‍යාපාරයකි.

- පසුගාමී ඛනිජතෙල් කර්මාන්තය ඇතුළු යම් උපයෝගීතා කර්මාන්ත නියාමනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ මහජන උපයෝගීතා කොමිසම 2002 අංක 35 දරන පනත මගින් ස්ථාපිත කර තිබේ.

- ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ සහාය ඇතිව ශ්‍රී ලංකාව තුළ සියළුම පෙරගාමී ඛනිජතෙල් මෙහෙයුම් පවත්වාගෙන යාම පිණිස. 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත මගින් එය වෙත වෙන්කර ඇති බලතල හා කාර්යයන් ඛනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුවට පැවරී තිබේ.

- ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය යනු, දේශීය ධාරිතාවය ගොඩනැගීමට අනුබල දෙන අතර, ගුණාත්මක භාවය. සෞඛ්‍යය, ආරක්ෂාව හා පරිසර ආරක්ෂණයට අවධානය යොමු කරමින්, ජාත්‍යන්තරව පිළිගත් තෙල් හා වායු ක්ෂේත්‍ර පරිචයන් අනුගමනය කරමින් ඛනිජතෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය හා සොයාගැනීමට අදාළ සියළුම කටයුතු පරිපාලනය කිරීමට ඛනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුවට සහායවීම භාරදී ඇති රාජ්‍ය අස්ථිත්වයයි. සැලසුම් කර තිබෙන පෙරගාමී ඛනිජතෙල් කර්මාන්තයේ නියාමක බවට පත්වීමට යෝජිතය.

මෙයට අතිරේකව, අනුමැතිය ලබාදීම, මූල්‍යකරණය, සහතික කිරීම, ධාරිතාවය ගොඩනැගීම හා මෙහෙයුම් අධීක්ෂණය කිරීම යනාදී වශයෙන් ඛනිජතෙල් මෙහෙයුම් කටයුතුවලට වක්‍රව සම්බන්ධ ආයතන කීපයක් ද පවතී. ඒවාට මධ්‍යම රාජ්‍ය ආයතන (අදාළ අමාත්‍යාංශ හා මහජන උපයෝගීතා ඇතුළු රේඛීය ආයතන), පළාත් පාලන අධිකාරීන්, මූල්‍ය ආයතන, පෞද්ගලික අංශයේ සමාගම්, ශාස්ත්‍රීය හා පර්යේෂණ ආයතන, මාධ්‍යය, සිවිල් සමාජය හා ප්‍රජා සංවිධාන අයත් වේ. අදාළ මධ්‍යම රජයේ ආයතන අතර ප්‍රධාන විෂය ක්ෂේත්‍ර වනුයේ පාරිසරික කළමනාකරණය, සමුද්‍ර පාරිසරික ආරක්ෂණය, මහජන මූල්‍ය, ප්‍රවාහන හා රථවාහන, වරායවල් හා නාවික කටයුතු, වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත්, විදුලි බලය හා බලශක්ති, ශ්‍රී ලංකා ප්‍රමිති, උසස් අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව, ආරක්ෂාව හා ආර්ථික/ආයෝජන කටයුතුය.

### 1.2 අවශ්‍යතාවය

බලශක්ති, කාර්මික, ප්‍රවාහන, ගෘහ හා වාණිජ අංශයන් හි බලශක්ති මූලාශ්‍රයක් වශයෙන් ද, කර්මාන්තමය අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යයක් වශයෙන් ද ස්වභාවික වායු භාවිත කිරීමෙන් ශ්‍රී ලංකාවට සැලකිය යුතු ආර්ථික, සමාජයීය හා පාරිසරික ප්‍රතිලාභ අත්කරගත හැකි බව පෙන්වාදීමට සැලකිය යුතු තරම් සාක්ෂි පවතී. කෙසේ වුවද, දේශීය ස්වභාවික වායු සම්පත් සංවර්ධනය හෝ ද්‍රවීකෘත ස්වභාවික වායු ආනයනයන් භාවිතය සම්බන්ධයෙන් හෝ පැන නගින ගැටළු නිරාකරණයෙහිලා ජාතික ප්‍රතිපත්ති රාමුවක් නොමැතිවීම මගින් මෙම විකල්පය ඵලදායී ලෙස උපයෝගී කරගැනීම සීමා කොට ඇත. එල්.පී.ජී. ඇතුළත් ඛනිජ තෙල් භාවිතය විෂයයෙහි නෛතික, නියාමන හා ආයතනික විධික්‍රමයන් ශ්‍රී ලංකාව විසින් ගොඩනගා ඇති නමුදු, පුළුල් පරාසයක විහිදී ආර්ථික අංශයන්හි ස්වභාවික වායු වාණිජමය අවශ්‍යතා සඳහා භාවිතය හා සම්බන්ධව පැන නැගිය හැකි නිශ්චිත ගැටළු නිරාකරණය කරනු ඇතැයි ඒ මගින් අපේක්ෂා කළ නොහැකිය.

ශ්‍රී ලංකාවට වාණිජමය වශයෙන් ශක්‍ය ස්වභාවික වායු කර්මාන්තයක් හඳුන්වාදීම, ආර්ථික ගනුදෙනු පුළුල් පරාසයක් ආවරණය වන පෙරගාමී ඛනිජතෙල් සම්පත් කැණීම් කටයුතුවල සිට පසුගාමී බෙදාහැරීම් මෙහෙයුම් දක්වා අගය දාම හරහා සම්බන්ධවේ. මෑතදී සොයාගත් වායු සම්පත් සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ආරම්භක පියවරින් අනතුරුව හා, විදුලි බලය ජනනය පිණිස ද්‍රවීකෘත ස්වභාවික වායු ආනයනය කිරීමේ තීරණය සමඟ, ස්වභාවික වායු ආර්ථික කටයුතු සඳහා භාවිතා කිරීමට සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම පිණිස ප්‍රතිපත්ති, නීතිමය, නියාමන හා ආයතනික රාමු ශක්තිමත් කිරීමේ වැදගත්කම බොහෝ පරදූකරුවන් විසින් පෙන්වා දී තිබේ. එම නිසා, සමස්ත ව්‍යායාමයටම මනාව නිර්මිත ජාතික ප්‍රතිපත්තියක මෙහෙයවීම හා අධීක්ෂණය අවශ්‍ය වේ. ඒ අනුව, අදාළ පරදූකරුවන්ගේ අදහස් විමසා, අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකාව සඳහා ස්වභාවික වායු සම්බන්ධයෙන් මෙම ජාතික ප්‍රතිපත්තිය සකස් කර තිබේ.

නුදුරේදීම දේශීය වශයෙන් නිෂ්පාදනය වන අඩු කාබන් බලශක්ති ප්‍රභවයක් හා අමු ද්‍රව්‍යයක ආර්ථික අගය උපරිමකරණය පිණිස සියළුම ක්ෂේත්‍ර ඔස්සේ ස්වභාවික වායු තිරසාර භාවිතය ව්‍යාප්ත කිරීමේ ''ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය'' ශ්‍රී ලංකා රජයේ අභිප්‍රාය ප්‍රකාශ කරයි. සියලුම පරදූකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරන බව තහවුරු කිරීම පිණිස කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය තුළ එය නිතිපතා සංශෝධනය කරන අතර, ඒ ඒ අනුවාදවල ක්‍රියාකාරී සැලැස්මක් (වායු උපයෝගීකරණ ප්‍රධාන සැලැස්ම - 4.1.5.9 කොටස) අඩංගු වන අතර, එය ඒ අනුව යාවත්කාලීන කරනු ඇත.

### 1.3 අරමුණ හා සන්දර්භය

ස්වභාවික වායු ශ්‍රී ලංකාවේ නව බලශක්ති මූලාශ්‍රයක් වශයෙන් හා කාර්මික යෙදවුමක් වශයෙන් හඳුන්වාදීම හේතුවෙන් ඇතිවෙතැයි අපේක්ෂිත ආර්ථික, තාක්ෂණික, පාරිසරික, ආරක්ෂක හා සමාජමය ගැටළු නිරාකරණය කිරීම ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කෙරේ. එබැවින්, එය අපේක්ෂා සහගත හා ඉදිරි දැක්මක් සහිත වූවකි. එමගින් ස්වභාවික වායු කර්මාන්තය තිරසර සංවර්ධනය කරාවූ පුළුල් ජාතික න්‍යාය පත්‍රය තුළ ස්ථානගත කරනු ලබයි. එබැවින්. ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ දැක්ම, අභිමතාර්ථ හා අරමුණු සාර්ව ආර්ථික ප්‍රතිපත්ති. බලශක්ති වැනි ක්ෂේත්‍රයන්හි අදාළ ආංශික ප්‍රතිපත්ති මෙන්ම තිරසර සංවර්ධන අභිමතාර්ථ සඳහා වූ ජාතික මට්ටමේ බැඳීම් හා කාලගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමේ ජාතික වශයෙන් තීරණය කරන ලද බැඳීම් ද හා අනුගතව හඳුනාගෙන ඇත. ජාතික ආර්ථිකයට දායකත්වය ලබාදෙන අතරතුර හා පරිසරය ආරක්ෂා කරන අතරතුර බලශක්ති සුරක්ෂිතතාව සහතික කරමින් ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් එම ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා බැඳීම් ද පරිපූරණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 1.4 තාර්කික පදනම

වායු ජාතික ප්‍රතිපත්තියේ තාර්කිකත්වය වනුයේ ශ්‍රී ලංකාව තුළ ආර්ථික වශයෙන් ශක්‍ය, පාරිසරික වශයෙන් තිරසාර හා සමාජමය වශයෙන් වගකිවයුතු ස්වභාවික වායු කර්මාන්තයක් ස්ථාපිත කිරීමට පහසුකම් සැපයීමයි. මෙය සාක්ෂාත් කරගැනීම පිණිස, රජයේ, පෞද්ගලික අංශයේ, සිවිල් සමාජයේ, පාරිභෝගිකයන්ගේ හා මහජනයාගේ භූමිකා මෙම ප්‍රතිපත්තිය විසින් පිළිගනී.

2003 අංක 26 දරන ඛනිජ තෙල් සම්පත් පනත ප්‍රකාරව, ස්වභාවික වායු දේශීය සම්පත්වල පරම අයිතිය මෙන්ම රටේ වත්මන් හා අනාගත පරම්පරාවල උපරිම යහපත තකා සම්පත් තිරසාර ලෙස සංවර්ධනය කිරීම හා භාවිතා කිරීමේ සමස්ත වගකීම රජය වෙත පැවරේ.

පෞද්ගලික අංශය ආර්ථික වර්ධනයේ ප්‍රේරකයා වශයෙන් අනුයාත ශ්‍රී ලංකා රජයන් විසින් පිළිගෙන තිබේ. පෞද්ගලික අංශය විසින් මෙහෙයවන වාණිජමය වශයෙන් සාර්ථක ස්වභාවික වායු පාදක ව්‍යවසාය ගැන බොහෝ කලාපීය උදාහරණ තිබේ. එසේ වුවද, ප්‍රාග්ධන සූක්ෂම සහ දියුණු තාක්ෂණික වර්ධනයන් අවශ්‍යවීම නිසා, විශ්ව ස්වභාවික වායු කර්මාන්තය තරගය අඩු කළ හැකි වෙළෙඳපොළ පංගුවක් ලබාගැනීමට පෙළඹෙන විශාල සංස්ථාපිත ව්‍යූහ වශයෙන් ඒකාබද්ධ කර තිබේ. පාරිභෝගික යහපත හා වෙළෙඳපොළ ආර්ථිකවල තිරසාර වර්ධනය සඳහා යහපත් තරගය අත්‍යාවශ්‍ය බැවින්, තරගකාරී සේවා හා නිෂ්පාදන සඳහා අවස්ථා බිහිකිරීමට හා ඉන් පසු, සහභාගී වන පෞද්ගලික අංශ ස්ථිතීන්ට සම ක්‍රියාකාරී භූමියක් තහවුරු කිරීම උදෙසා රජයට ඉතා වැදගත් භූමිකාවක් ඉටුකිරීමට තිබේ.

දේශීය සම්පත්වල භාරකරු හා දේශීය වෙළෙඳපොළ පද්ධතියේ නියාමක යන භූමිකා දෙකම ඉටුකිරීමට අමතරව, රජය විසින් පහත දැක්වෙන ක්ෂේත්‍රවල ද වෙනත් බහුවිධ භූමිකාවන් ඉටුකිරීම අපේක්ෂා කෙරේ : යටිතල පහසුකම් විකාසය අධීක්ෂණය කිරීම, ආයෝජනවලට පහසුකම් සැපයීම, යහපත් කර්මාන්තීය පරිචයන් ප්‍රවර්ධනය කිරීම, පරිසරය සුරැකීම. මහජන සෞඛ්‍ය අවදානම් අවම කිරීම. දුෂ්පරිහරණය තුළින් ඇතිවන හදිසි අනතුරු වැලැක්වීම, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ධර්මතාවයන්, උපදෙස් සංග්‍රහ හා ප්‍රමිති අනුගමනය කිරීම, අනෙක් තරගකරුවන්ගේ හැසිරීම නිතිපතා අධීක්ෂණය කිරීම සහ අවසාන

ප්‍රතිලාභීන් වශයෙන් පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකීම. රජය හා පෞද්ගලික අංශය ද ඇතුළුව වෙනත් පරදුකරුවන් කාර්යක්ෂම බහුවිධ භූමිකා ඉටුකිරීමට පාරදෘශ්‍ය, වගවන හා සමස්ත පාලන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඉලක්ක කරයි. ජාත්‍යන්තර ප්‍රවීණතාවය හා විදේශීය සෘජු ආයෝජන මූලික පංගුකාර ප්‍රේක්ෂාවලියේ අත්‍යාවශ්‍ය කොටසක් බැවින්, මෙම ස්ථිතීන් විසින් ලබාදෙන දැනුම හා තාක්ෂණ හුවමාරුව ප්‍රේක්ෂාවලියේ අත්‍යාවශ්‍ය කොටසක් බැවින්, මෙම ස්ථිතීන් විසින් ලබාදෙන දැනුම හා තාක්ෂණ හුවමාරුව ශ්‍රී ලංකාවට ප්‍රතිලාභයක් ලබාගත හැකි පරිදි, ව්‍යාපාර කිරීමේ පහසුව, වෙළඳපොළ අවදානම අඩුකිරීම හා ඉල්ලුම වැඩිකිරීම වඩා යහපත් කරන සාධකවලට ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය විසින් විශේෂ අවධානයක් යොමු කරනු ඇත. අපයෝජන, අවකල් ක්‍රියා හා දූෂණයන්ගෙන් සහ තරගකාරිත්වයට ප්‍රතිවිරෝධී චර්යාවන්ගෙන් තොරව පවත්වාගෙන යා හැකි ක්‍රමයක් පිහිටුවා නඩත්තු කළහැකි වනු පිණිස සිවිල් සමාජය, මාධ්‍යය හා පොදු ජනතාව විසින් වැදගත් කාර්යභාරයන් ගණනාවක් ඉටු කළ යුතුව පවතී.

## 2. දැක්ම, අභිමතාර්ථ හා අරමුණු

ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ දැක්ම, අභිමතාර්ථ හා අරමුණු මෙම කොටස තුළ ඉදිරිපත් කෙරේ. මෙයට දැක්ම පිළිබඳ පුළුල් ප්‍රකාශනයක් හා ප්‍රධාන ප්‍රතිපත්ති අභිමතාර්ථ හා අරමුණු ගණනාවක් ඇතුළත් වේ.

### 2.1 දැක්ම

ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ පුළුල් පරාසයක විහිදී ආර්ථික අංශයන් ගණනාවක් වෙත නව බලශක්ති මූලාශ්‍රයක් හා කර්මාන්තීය අමුද්‍රව්‍යයක් වශයෙන් ස්වභාවික වායු හඳුන්වාදීම මගින් තිරසාර ආර්ථික, සමාජයීය හා පාරිසරික ප්‍රතිලාභ සාක්ෂාත් කරගැනීමයි.

### 2.2 අභිමතාර්ථ

ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් පහත සඳහන් අභිමතාර්ථ සාධනය අපේක්ෂා කෙරේ :

- 2030 වන විට සමස්ත බලශක්ති මිශ්‍රණයෙන් 30%ක අවමයක් පවත්වා ගනිමින් සියළු අංශ තුළට ස්වභාවික වායු ක්‍රමානුකූලව හඳුන්වා දීම,
- දේශීය වායු සම්පත් අපනයනය හා ස්වභාවික වායු භාවිතයෙන් සිදුකරනු ලබන වානිජ කටයුතු මගින් විදේශ විනිමය ඉපැයුම් සඳහා වූ ලාභදායක මාර්ගයක් නිර්මාණය කිරීම,
- ශ්‍රී ලංකාව විසින් දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම වෙත ලබාදෙන ලද ජාතික වශයෙන් තීරණය කරන ලද බැඳීම් වශයෙන් පනවන ලද ඉලක්ක සපුරාගත හැකිවනු පිණිස හරිතාගාර වායු විමෝචනය අවම කිරීම,
- මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිශ්චය කරන ලද අවට වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිතීන් සාක්ෂාත් කරගත හැකිවනු පිණිස දේශීය වායු දූෂණයට දයක වන්නා වූ වෙනත් හානිකර වායුවල මට්ටම අවම කිරීම,
- ආයෝජන, තාක්ෂණය හුවමාරුව හා අනෙකුත් ඵලදායී දයකත්වය දිරිමත් කිරීම සඳහා ස්වභාවික වායු කර්මාන්තය හා ඒ ආශ්‍රිත කර්මාන්ත සඳහා දේශීය හා අන්තර්ජාතික පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිමත් කෙරෙන ශක්තිමත් ක්‍රියා රාමුවක් ඇති කිරීම,
- 2021 වන විට නිෂ්පාදකයන්. සැපයුම්කරුවන් හා පාරිභෝගිකයන් වෙතින් ස්වභාවික වායු පිළිබඳව ඵලදායී චර්යාත්මක ප්‍රතිචාරයන් ලබාගැනීම සඳහා වූ ශක්තිමක් නෛතික, නියාමන හා ආයතනික වැඩපිළිවෙලක් සහිත ශක්තිමත් ක්‍රියාරාමුවක් සැකසීම,
- ස්වභාවික වායු මත ස්ථාවරව හා ශක්තිමත් ලෙස කෙරෙන විදේශීය හා දේශීය ආයෝජනයන් මගින් ගොඩනැගෙන උසස් දේශීය අගයකින් යුත් කුසලතා පූර්ණ සේවා නියුක්ති හා ව්‍යාපාරික අවස්ථා විෂයයෙහි ප්‍රගතිශීලී වර්ධනයක් ඇති කිරීම.

**2.3 අරමුණු**

ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ සමස්ත අරමුණ වනුයේ කෙටිකාලීනව, මධ්‍යකාලීනව හා දිගු කාලීනව ශ්‍රී ලංකාව වෙත ප්‍රශස්ත හා සමසේ විහිදී යන්නා වූ ප්‍රතිලාභ ලැබෙන බවට සහතික කරන්නා වූ ස්වභාවික වායු අගය දාමයක් තිරසර ලෙස ගොඩනැගීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් ලබාදීමයි. මෙම ඉලක්කය පහත සඳහන් නිශ්චිත අරමුණු ඉටුකර ගැනීම තුළින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කෙරේ.

- දේශීයව නිෂ්පාදනය කිරීම හා ආනයනය මගින් ප්‍රධාන ආර්ථික අංශ සඳහා අඛණ්ඩ ස්වභාවික වායු සැපයුමක් ලැබෙන බවට තහවුරු කිරීම,

- වායු විමෝචන තීව්‍රතා සහිත බලශක්ති ප්‍රභවයන් වෙනුවට විකල්ප බලශක්ති ප්‍රභවයක් වශයෙන් බලශක්ති, ප්‍රවාහන, කර්මාන්ත, වාණිජ හා නේවාසික යන අංශවල ස්වභාවික වායු භාවිතය දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය,

- තාක්ෂණික හා වානිජමය වටිනාකමක් ඇති අමුද්‍රව්‍යයක් ලෙස පොහොර, රසායන ද්‍රව්‍ය නිෂ්පාදන වැනි කර්මාන්ත සඳහා ස්වාභාවික වායු භාවිතය ප්‍රවර්ධනය කිරීම,

- රාජ්‍ය මට්ටමෙන් පිළිගත් සුදුසු දිරිගැන්වීමේ යෝජනාක්‍රම සහිත ඛනිජතෙල් සම්පත් ගිවිසුම් මගින් දේශීය සම්පත්වලින් වාණිජමය ස්වභාවික වායු නිෂ්පාදන කටයුතු සිදුකිරීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර ආයෝජකයන් විසින් සිදුකරන ආයෝජන ප්‍රවර්ධනය හා ඒවා සඳහා පහසුකම් සැලසීම,

- දේශීය නිෂ්පාදන හා ආනයනයන් මගින් දේශීය වෙළෙඳපොළ, නැව්තෙල් ව්‍යාපාරය හා අපනයන වෙළෙඳපොළ වෙත ස්වභාවික වායු සැපයුම නගා සිටුවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම,

- රටක් වශයෙන් වඩාත් තරගකාරී මිල ගණන් යටතේ ස්වභාවික ද්‍රවීකෘත වායු අවම අවධානමක් යටතේ අත්පත් කර ගැනීමේ හැකියාව ලබාගැනීම සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු ප්‍රසම්පාදනය සඳහා පාරදෘශ්‍ය තරගකාරී ක්‍රියා පරිපාටියක් අනුගමනය කිරීම.

- ස්ථිර ආයෝජනයන් සිදු කිරීම සඳහා සැපයුම්කරුවන් දිරිගන්වන සුළු ආකර්ශනීය ප්‍රතිලාභ සහතික කරන අතරතුර දැරිය හැකි මිළ ගණන්වලට ස්වභාවික වායු ලබාගැනීමේ හැකියාව පාරිභෝගිකයන් වෙත සලසන්නා වූ මිල යාන්ත්‍රණයක් ගොඩනැංවීම,

- ස්වභාවික වායු කර්මාන්තයේ උද්ගාමී, මධ්‍ය සහ පසුගාමී අංශ සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සෞඛ්‍ය ආරක්ෂණ, පාරිසරික, සමාජීය සහ ස්ත්‍රී පුරුෂභාවය ආරක්ෂා කිරීමට අදාල ප්‍රමිතිවලට අනුගත වීම.

- ස්වභාවික වායු කර්මාන්තයේ උද්ගාමී, මධ්‍ය සහ පසුගාමී අංශවල මෙහෙයුම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදීම, බලපත් ලබාදීම හා අවසර ලබාදීම ද ඇතුළත්ව ස්වභාවික වායු ගවේෂණය, උපයෝජනය, පිරිපහදුව, පිරිසැකසුම, ආනයනය, ප්‍රතිවායුකරණය, ගබඩාකරණය, අපනයනය, නැව්තෙල් සැපයුම, සම්ප්‍රේෂණය, බෙදාහැරීම හා පරිභෝජනය ද ඇතුළත් සියළු මෙහෙයුම් යහපත්ව සිදු කෙරෙන බවට සහතික වන්නා වූ ශක්තිමත් ප්‍රතිපත්තිමය, නෛතික හා නියාමන රාමුවක් සකසා ක්‍රියාත්මක කිරීම,

- ස්වභාවික වායු සැපයුම් දාමයට අදාළ මිළ, ප්‍රමිතිය හා විශ්වාසනීයභාවය පරිභෝජකයා වෙනුවෙන් තහවුරු කිරීම, නියාමනය කිරීම,

- ස්වභාවික වායු කර්මාන්තයේ උද්ගාමී, මධ්‍ය සහ පසුගාමී අංශවල සිදුවන සියළු මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගත් ආරක්ෂක ප්‍රමිතීන්. චර්යා ධර්ම පද්ධතීන් විනිවිධභාවය සහිතව හා යහ පරිචයන් සකස්කොට ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම,

- වාණිජමය ව්‍යාපාරික මධ්‍යස්ථාන වශයෙන් ශ්‍රී ලාංකීය වරායන්හි ද්‍රවීකෘත ස්වභාවික වායු මගින් ක්‍රියාත්මක වන මුහුදු යාත්‍රා වෙත ඉන්ධන සැපයුම් පහසුකම් ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය හා අපනයන වෙළෙඳපොළක් වෙත ස්වභාවික වායු සැපයීමේ විකල්ප පිළිබඳ සොයා බැලීම,

- දේශීය විශේෂඥ දැනුම හා තාක්ෂණික නිපුණතාවයන් ගොඩ නැංවීමේ පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම හා දේශීය සංදර්භය තුළ වටිනාකම උපරිම කෙරෙන පරිදි ස්වභාවික වායු කර්මාන්තයේ නියැළීමට අපේක්ෂා කරන්නා වූ දේශීය ව්‍යාපාරයන්හි ධාරිතාවය සංවර්ධනය කිරීම දිරිමත් කරන යෝජනාක්‍රම හඳුන්වාදීම.

3. ප්‍රධාන ප්‍රතිපත්ති මූලධර්ම

ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රධාන මූලධර්ම හයක් මත ගොඩනගා ඇත. ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග තෝරාගැනීම මෙම මූලධර්මයන්හි මග පෙන්වීම යටතේ සිදුකරන ලදී.

3.1 බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම

භෞතිකව පවත්නා බව තුළ මිළ ගණන්හි උච්චාවචනයන් අවම කරමින් දැරිය හැකි මිල ගණන්වලට නොකඩවා බලශක්තිය සපයා දීම සුරක්ෂිතතාව යන්නෙන් හැඟෙන අදහසයි. බලශක්ති සුරක්ෂිතතාවේ පුළුල් මානයන් වනුයේ සුලභතාවය, ප්‍රවේශ හැකියාව, දැරිය හැකි බව හා පිළිගත හැකි බවයි. ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් ආනයනික ෆොසිල ඉන්ධන මත යැපීම අවම කරමින් ප්‍රධාන ආර්ථික අංශ සඳහා වූ විකල්ප බලශක්ති මූලාශ්‍රයක් වශයෙන් ස්වභාවික වායු පරිහරණය හඳුන්වා දෙමින් හා ප්‍රවර්ධනය කරමින් බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳ මාන හතරම නංවාලීමට අපේක්ෂා කරයි.

3.2 සුපිරිසිදු බලශක්තිය මගින් පරිසරය ආරක්ෂා කිරීම

ජාතික බලශක්ති මිශ්‍රණයේ දායකත්වය ක්‍රමානුකූලව වර්ධනය වෙමින් පවත්නා විමෝචන තීව්‍ර ඛනිජතෙල් ඉන්ධන හා ගල් අඟුරු සඳහා සාපේක්ෂව වඩාත් පිරිසිදු විකල්පයක් ද්‍රවීකෘත ස්වභාවික වායු මගින් සපයා දෙනු ලබයි. එබැවින්, පාර්ශ්වීය හෝ පූර්ණ වශයෙන් ඛනිජතෙල් හා ගල් අඟුරු සඳහා ආදේශනය මගින් බලශක්ති සංයුතියේ ස්වභාවික වායු ප්‍රතිශතය වර්ධනය කිරීම විමෝචනයන් අවම කිරීම මගින් පරිසරය ආරක්ෂා කිරීමට උපකාරී වනු ඇත. මෙය දේශගුණික විපර්යාසයන්හි බලපෑම සමනය කරමින් වායු දූෂණය ආශ්‍රිත මානව සෞඛ්‍ය අවදානම් හා පාරිසරික පද්ධති හානි අවම කිරීමට උපකාරී වනු ඇත.

3.3 සෞඛ්‍යය, ආරක්ෂණ හා පාරිසරික අවදානම් අවමකරණය සහතික කිරීම

ජාතික ආර්ථිකයට හා පරිසරයට අපේක්ෂිත ප්‍රතිලාභ ලබාදෙන නමුදු, ස්වභාවික වායු වූ කලී, එහි වහා ගිනි ඇවිලෙන සුළු ස්වභාවය හේතුවෙන් අතිශයින් ප්‍රවේශම්කාරී ලෙස පරිහරණය කළයුතු නිෂ්පාදනයකි. නිසි ආරක්ෂක පූර්ව සූදානම්කාරී පියවර නොගතහොත්, ද්‍රවීකෘත ස්වභාවික වායු, ද්‍රවීකෘත ස්වභාවික වායු මෙන්ම සම්පීඩිත ස්වභාවික වායු (CNG) භාවිතය මගින්ද මනුෂ්‍ය ජීවිත හානි මෙන්ම දේපළ හානි ද ඇති කරන්නා වූ හානිකර සිදුවීම් ඇතිකළ හැකිය. එබැවින්, ජාත්‍යන්තර පිළිගත් ආරක්ෂක ප්‍රමිති, චර්යා පද්ධතීන් හා යහ පරිචයන් ක්‍රියාත්මක කිරීම මගින් මහජන ආරක්ෂාව සහතික කරමින් ආපද අවදානම අවම කිරීම ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කරා මග පෙන්වන්නා වූ ප්‍රධාන මූලධර්මයක් වේ.

3.4 දේශීය සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතය

ජාතික ආර්ථික අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීමෙහි ලා තීරණාත්මක ලෙස දේශීය හා ලෝක වෙළෙඳපොළ අවස්ථාවන විවර කිරීමේ ශක්‍යතාවයක් ඛනිජතෙල් සතු වේ. මේ දක්වා විදුලිබල, ප්‍රවාහන, කාර්මික හා ගෘහස්ථ අංශ වෙතින් බලශක්තිය සඳහා කෙරෙන ඉල්ලුම සපුරාලීම සඳහා ඛනිජතෙල් ආනයනයන් මත රඳා පැවැත්මට සිදුව ඇත. ෆොසිල ඉන්ධන ආනයනයන් සඳහා අප රට විසින් සිය විදේශ විනිමයෙන් සැලකිය යුතු කොටසක් වැය කරමින් සිටී. මන්නාරම් ද්‍රෝණිය තුළ සොයාගත් ස්වභාවික වායු සම්පත් මගින් අපනයනයන් හරහා විදේශ විනිමය උපයා ගැනීමේ විභවීය අපේක්ෂාවන් ද සහිතව ෆොසිල ඉන්ධන ආනයනයන් මත රඳා පැවැත්ම අවම කිරීම සඳහා ශ්‍රී ලංකාව වෙත අවස්ථාව සලසනු ලබයි. එබැවින් යෝග්‍ය දේශීය ස්වභාවික වායු කර්මාන්තයක් ස්ථාපනය මගින් ජාතික ආර්ථිකයට ලැබෙන්නා වූ ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා දේශීය සම්පත් ප්‍රශස්ත අයුරින් ප්‍රයෝජනයට ගැනීම ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට මඟ පෙන්වූවා වූ ප්‍රධාන පදනම්ගත මූලධර්මයකි.

3.5 ඵලදායී නියාමන පාලන ක්‍රමයක් යටතේ පුද්ගලික අංශ සහභාගිත්වය ඉහළ නැංවීම

පුද්ගලික අංශය විසින් ස්වභාවික වායු කර්මාන්තය ද ඇතුළත්ව ලෝක බලශක්ති වෙළඳපොළෙහි නියමු කාර්ය භාරයක් ඉටුකරනු ලබයි. කර්මාන්තයේ වර්ධනය කෙරෙහි ආයෝජනය කිරීම පිණිස ප්‍රමාණවත් ප්‍රතිලාභ උත්පාදන කරන්නා වූ ලාභදායක ලෙස ක්‍රියාත්මක වන්නා වූ පෞද්ගලික ස්වභාවික වායු ව්‍යාපාර ද ලොව පුරා පවතී. මෙයට ප්‍රතිවිරුද්ධව ශ්‍රී ලංකාවේ බලශක්ති අංශය රජයට අයත් ව්‍යාපාරයන් මගින් යටත්කොට ඇත. ශ්‍රී ලංකාවට ස්වභාවික වායු කර්මාන්තය හඳුන්වාදීම මගින් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ සැලසෙන්නා වූ නියමයක් මත ඵළදයී ආකාරයෙන් පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීමේ අවස්ථාව විවර කරනු ලබයි. පුද්ගලික අංශ සහභාගීත්වය මගින් උපරිම ප්‍රතිලාභ අත්පත් කරගනු පිණිස ඵලදායී නියාමන හා අධීක්ෂණ පාලන ක්‍රමයක් අවශ්‍ය වේ. ජාතික ආර්ථිකය හා මහජනතාව වෙත සැලසෙන්නා වූ ප්‍රතිලාභ ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමා සඳහා මනාසේ සැලසුම් කළ නියාමන පාලන තන්ත්‍රයක් යටතේ පුද්ගලික අංශ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම මගින් මෙම අවස්ථාව අත්පත් කර ගැනීම ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ ඉලක්කයයි.

**3.6 අනුවර්තක සංවර්ධන හා සියල්ලන් අන්තර්ගත ප්‍රතිලාභ සඳහා වෙළෙඳපොළ ප්‍රශස්තකරණය**

වායු අගය දාමයන් තුළ විවිධ පරදූකරුවන් විසින් භුක්ති විඳිනු ලබන සමස්ත ප්‍රතිලාභ ක්‍රමයන් තීරණය කරන්නා වූ සංකීර්ණ වෙළෙඳපොළ ආකෘති අන්තරගත වේ. අතිශයින් ඒකාග්‍ර වූ සිරස් ඒකාබද්ධතාවයකින් යුත් ව්‍යුවහයන්හි සිට ව්‍යාපාරික ආයතන අතර විවෘත තරගකාරිත්වයක් සහිත නොබැඳුණු සැපයුම් දමයන් සහිත කර්මාන්ත දක්වා විහිදෙන විවිධාකාර වූ වෙළෙඳපොළ ව්‍යුහයන් යටතේ ස්වාභාවික වායු කර්මාන්තයට ක්‍රියාත්මක විය හැකි බව ස්වභාවික වායු වෙළඳපොළ පිළිබඳ අධ්‍යයනයන් මගින් තහවුරු කොට ඇත. තරගය සඳහා විවෘත වෙළඳපොළ ව්‍යුහයන් තුළින් සංවෘත වෙළඳපොළ ව්‍යුහයකට වඩා කාර්යක්ෂම හා සාධාරණ ප්‍රතිඵල උත්පාදනය කළ හැකි බව පොදුවේ නිරීක්ෂණය කොට ඇත. ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් පිළිබඳ වර්තමාන වෙළඳපොළ ව්‍යුහය වැඩි වශයෙන් රජය සතු ව්‍යාපාර ආයතන විසින් සංවෘත ව්‍යුහයක් කරා නැඹුරු කර ඇත. දැනට පවතින රාජ්‍ය අංශ ඒකාධිකාරයකට නැඹුරුවෙන් වියුක්තව, ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය විසින් ශ්‍රී ලංකාවේ අනාගත ස්වභාවික වායු කර්මාන්තයේ ව්‍යුහය සම්බන්ධයෙන් සමබර ප්‍රවේශයක් ගනු ඇත. අනුවර්තනීය ප්‍රවේශයක් මගින් වෙනස් වෙමින් පවත්නා දේශීය හා ජාත්‍යන්තර තත්ත්වයන් යටතේ කර්මාන්තයේ සංවර්ධනයේ විවිධ අදියරයනට යෝග්‍ය වන්නා වූ ප්‍රශස්ත වෙළෙඳපොළ ව්‍යුහයන් සොයා යාම එහි අපේක්ෂාවයි. එසේ කිරීමේදී ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් නිත්‍ය වශයෙන් ම පෞද්ගලික අංශයේ සක්‍රීය සහභාගීත්වය සමඟින් වෙළඳපොළ තරගකාරීත්වය නංවාලීමට උත්සාහ දරනු ඇත.

**4. ප්‍රතිපත්ති ප්‍රකාශන**

මෙම කොටස ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ ප්‍රධානාංගය වේ. විකල්ප බලශක්ති ප්‍රභවයන් වශයෙනුත් කර්මාන්ත ක්ෂේත්‍රයේ අමුද්‍රව්‍යයක් වශයෙනුත් ස්වභාවික වායු හඳුන්වාදීම තුළින් පැන නගින ගැටළු නිරාකරණය කරමින් ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ දැක්ම, අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සකසන ලද ප්‍රතිපත්ති ප්‍රකාශන මෙහිදී ඉදිරිපත් කෙරේ. ස්වභාවික වායු බහුවිධ ආර්ථික අංශයන්හි ප්‍රයෝජනය සඳහා යොදාගත හැකිය. බහුවිධ අංශයන් තුළට ස්වභාවික වායු හඳුන්වාදීම විවිධ අංශවල පොදු අවශ්‍යතා ඇති කිරීම මෙන්ම මනා කොට සැලසුම්ගත ප්‍රතිපත්ති මගින් ඒ ඒ අංශවල සුවිශේෂි ගැටළු නිරාකරණය කෙරෙහි බලපායි.

ඒ අනුව, මෙහිලා ප්‍රතිපත්ති ප්‍රකාශන පුළුල් අංශ දෙකක් යටතේ ඉදිරිපත් කෙරේ.

- බහුවිධ ආර්ථික අංශයන්හි ස්වභාවික වායු භාවිතයේ දී ඇතිවන විවිධ ක්ෂේත්‍රවල පොදු අවශ්‍යතා ඉටු කරන්නාවූ ප්‍රතිපත්ති ; සහ

- ප්‍රධාන ආර්ථික අංශයන්හි ස්වභාවික වායු පරිහරණයට අදාළව ඇති එම අංශවලට සුවිශේෂි වූ (එනම්, විදුලිබල අංශය, ප්‍රවාහන අංශය, කර්මාන්ත අංශය, ගෘහස්ථ හා වාණිජ අංශය හා නැව්තෙල් සැපයුම් අංශය) ගැටළු නිරාකරණය කරන්නා වූ ප්‍රතිපත්ති.

**4.1 බහුවිධ ආර්ථික අංශයන්හි ස්වභාවික වායු භාවිතයේ දී ඇතිවන විවිධ ක්ෂේත්‍රවල පොදු අවශ්‍යතා ඉටුකරන්නා වූ ප්‍රතිපත්ති**

බහුවිධ අංශයන්හි පවත්නා පොදු අවශ්‍යතා ඉටුකිරීමට කටයුතු කිරීම, ස්වභාවික වායු කරා විතැන් වීමෙන් ලාභ ඉපැයීමේ විභවය සහිත එක් එක් අංශයන් තුළ ස්වභාවික වායු භාවිතය ප්‍රවර්ධනය සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියකි. එබැවින්, විවිධ ක්ෂේත්‍රයන්හි පොදු අවශ්‍යතා ඉටුකිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති රටේ ස්වභාවික වායු කර්මාන්තයේ කොඳු නාරටිය බඳු වේ. විවිධ ක්ෂේත්‍රවල පොදු අවශ්‍යතා පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශන පුළුල් ක්ෂේත්‍ර අටක් යටතේ ඉදිරිපත් කෙරේ. ඒවානම්, ස්වභාවික වායු සපයා ගැනීම හා බෙදාහැරීම, යටිතල පහසුකම් සංවර්ධන, පාරිසරික තිරසරභාවය, මිළකරණය. ආයතනික, නියාමන හා ප්‍රතිපත්ති රාමුව, මෙහෙයුම් ආරක්ෂාව, ධාරිතා හා දේශීය වශයෙන් අනන්‍යතා සංවර්ධනය හා පරිභෝජනය හා වෙළඳපොළ සංවර්ධනයයි.

4.1.1 ස්වභාවික වායු සපයා ගැනීම හා බෙදා හැරීම

4.1.1.1. ස්වභාවික වායු අගය දාමයන්හි අන්තර්ගත පෙරගාමී. මධ්‍ය සහ පසුගාමී මෙහෙයුම්වල දී අදාළ වන්නාවූ සංවර්ධන හා නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මගින් දේශීය සම්පත් උපයෝජනයෙන් මෙන්ම ආනයනයන් මගින් ස්වභාවික වායු කරා ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම් රජය විසින් සලසනු ඇත. මේ තුළ අනාගත බදු ව්‍යුහය වෙනස් වීම් තුළින් හෝ සහනාධාර ලබා දීමේ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් ආනගතයේ දී අයෝජකයින් ආරක්ෂා කිරීම තුළ අනාගත බදු නම්‍ය පිරිවැය ආදයම් බෙදීම, බහු පාර්ශ්විය නිෂ්පාදකයන් අතර දේශීය ඉල්ලුම සමසේ බෙදාහැරීම සහ දේශීය වායු නිෂ්පාදනය සහ ආනයනික් ද්‍රවිකෘත ස්වභාවික වායු යන අංශ දෙක අතර වෙළෙඳපොළ බෙදීයාම් සුදුසු යාන්ත්‍රණයක් පැවතීම යනාදී ස්ථාවර රාජ්‍ය ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ යාන්ත්‍රණයක් ඇතුළත් වේ.

4.1.1.2 දේශීය මූලාශ්‍ර වෙතින් ස්වභාවික වායු සපයා ගැනීමට අදාළ පෙරගාමී මෙහෙයුම් කටයුතු අදාළ සංවර්ධන ආයතන තෝරාගැනීමේ පාරදෘශ්‍ය ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරමින්, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුගත වන්නා වූ බලපත්‍රකරණ කාර්ය පරිපාටිනට අනුගත වීම හා අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ අත්වන්නා වූ කොන්දේසි යටතේ කොන්ත්‍රාත්තුමය වැඩ පිළිවෙලවලට ප්‍රවේශවීම මගින් සාක්ෂාත් කරගනු ඇත. මෙම කොන්දේසි ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කාර්යයන් වර්ධනය කරනු ලබන අතර ද්විතීය වෙළඳපොළ ගනුදෙනු සඳහා ද පහසුකම් සලසයි.

4.1.1.3 ජීව වායු හෝ වාණිජ මට්ටමෙන් නිෂ්පාදනය කරනු ලබන එහි විවිධ කාණ්ඩ මෙහෙයුම් පරිචයන් තුළ විශේෂිතව දක්වා ඇති ගුණාත්මක භාවය, ආරක්ෂණය සහ අන්තර් සම්බන්ධිත ප්‍රමිතීන්වලට යටත්ව ස්වභාවික වායු ගබඩා හා එහි බෙදාහැරීම් ජාලයට ප්‍රවේශය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම විසින් පහසුකම් සලසනු ලැබේ.

4.1.1.4 ආයෝජන ප්‍රතිලාභ ද ආරක්ෂාවන පරිදි ජාතික ආර්ථිකයකට උපරිම ප්‍රතිලාභ අත්පත් කරගත හැකිවනු පිණිස සියළු ඉල්ලුම් අංශවලට සැපයීම තහවුරු කරමින් දේශීය ඉල්ලුම සපුරාලීමට හා අපනයන වෙළඳපොළ වෙතින් ලැබෙන ඉල්ලුම සපුරාලීමට දේශීය මූලාශ්‍රයන් වෙතින් සිදුකෙරෙන සැපයුම් කෙරෙහි යොමුවනු ඇත.

4.1.1.5 දේශීය මූලාශ්‍ර වෙතින් සිදු කෙරෙන සැපයුම් සඳහා පරිපූරික මාර්ගයන් වශයෙන් විදුලිබල, ප්‍රවාහන, කර්මාන්ත, වාණිජ, ගෘහස්ථ අංශවලින් මෙන්ම නාවික මෙහෙයුම් සඳහා කෙරෙන ඉල්ලුමට ද්‍රවීකෘත ස්වභාවික වායු ආකාරයෙන් හෝ වෙනත් කිසියම් ආකාරයකින් ස්වභාවික වායු ආනයනයට අදළ පෙරගාමී සහ පසුගාමී කර්මාන්තීය මෙහෙයුම් ස්ථාපනයට ද රජය විසින් පහසුකම් සලසනු ඇත.

4.1.1.6 ප්‍රධාන වශයෙන් සහායක සැපයුම් මූලාශ්‍රයක් වශයෙන් ස්වභාවික වායු ආනයනයට පහසුකම් සලසනු ලබන්නේ :

- දේශීය මූලාශ්‍රයන් වෙතින් වාණිජ මට්ටමේ සැපයුම් ඉදිරිපත් කිරීමට ප්‍රථම දේශීය වශයෙන් පරිභරණය කරන්නන්ගේ ඉල්ලුම් සපුරාලීමටත් ;

- දේශීය මූලාශ්‍රයන් වෙතින් සිදුකෙරෙන සැපයුම් උච්චාවචනයන් සඳහා ස්වාරක්ෂක උපාය මාර්ගයක් වශයෙන් අඛණ්ඩව සැපයුමක් සහතික කිරීමටත් ;

- පරිභරණය කරන්නන් හට දැරිය හැකි මිළ මට්ටම් පවත්වාගත හැකිවනු පිණිස දේශීය වායු කර්මාන්තය සඳහා මනා තරගකාරිත්වයක් ඇති කිරීමටත් ය.

4.1.1.7 රාජ්‍ය අංශ නියෝජිතායතන විසින් හෝ පුද්ගලික පාර්ශ්වයන් විසින් හෝ ශ්‍රී ලංකාව තුළ ස්වභාවික වායු ප්‍රසම්පාදනය, පර්යන්ත මෙහෙයුම්, ගබඩාකරණය, බෙද හැරීම හා පරිභෝජනය ඇතුළත්වන අගය දම ආශ්‍රිත කාර්යයන්හි සියළු අදියරයන් ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කරමින් කළාපීය හෝ ගෝලීය බලශක්ති වෙළඳපොළවල ක්‍රමෝපායික ස්ථාවරත්වය නංවාලන්නා වූ ආකාරයෙන් සිදු කෙරෙනු ඇත.

4.1.1.8 ඉහත 4.1.1.7 වගන්තියට යටත්ව, පහත සඳහන් අයුරින් ස්වභාවික වායු ආනයනික වෙළඳපොළ වෙතින් ලබා ගැනීමට රාජ්‍ය ව්‍යාපාර ආයතන හෝ පෞද්ගලික අංශය වෙත ඛනිජතෙල් විෂයභාර අමාත්‍යාංශය හරහා රජය විසින් පහසුකම් සැපයීම හා කළමනාකරණය කිරීම සිදු කරයි.

- ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයුම් කරුවන් එක් අයෙකු හෝ වැඩි දෙනෙකු සමග සෘජු සාකච්ඡා පැවැත්වීම (රජයෙන් රජයට පදනම හෝ වෙනත් ක්‍රමයකින්)

- ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයුම් කරුවන් වෙතින් අර්ධ කාලීන හෝ දීර්ඝ කාලීන සැපයීම[1] සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීම (උදා : කිසියම් කාල පරාසයකට සැපයුම්)

- කෙටි කාලීන සැපයුම් සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු විවෘත වෙළඳපොළින් තරගකාරී ලංසු කැඳවා සිදු කරන සෘජු මිළදී ගැනීම්.

4.1.1.9 ද්‍රවීකෘත ස්වභාවික වායු යනු කර්මාන්තයක් වශයෙන් වර්ධනය වන්නා වූ ද, සෘජු මිළදී ගැනීමේ වෙළඳපොළක් වර්ධනය වන්නා වූ ද, ගෝලීය වශයෙන් පවතින භාණ්ඩයකි. අනෙකුත් භාණ්ඩ ප්‍රසම්පාදනය කරන ආකාරයෙන්ම ස්වභාවික වායු මිලදී ගැනීමේ සියළු ගනුදෙනු ද පාරදෘශ්‍ය හා තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටින් අනුගමනය කෙරෙන ක්‍රමවේදයක් රජය විසින් ඇති කරනු ලැබේ. ශ්‍රී ලංකාව වෙත තරගකාරී වාසියක් අත්පත් කරදෙනු පිණිස මිල, මිලදී ගනු ලබන කාලය, ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවශ්‍යතා බඳු ප්‍රධාන සාධක කෙරෙහි අවධානය යොමු කරමින් ස්වභාවික වායු සම්පාදනය සිදු කෙරෙනු ඇත.

[1] මධ්‍ය කාලීන යනු වසර 2 සිට 5 දක්වා වූ කාලය ; කෙටි කාලීන යනු වසර 2ට අඩු සහ දීර්ඝ කාලීන යනු වසර 5ට වැඩි.
(ජාත්‍යන්තර වායු සංගමය - 2017 වාර්තාව)

4.1.1.10 ශ්‍රී ලංකාව දේශීයව පවතින හයිඩ්‍රොකාබන් ගවේෂණය කොට නිෂ්පාදනය කිරීමේ කාර්යය ප්‍රමුඛත්වය දී සිදු කරන බැවින් ශ්‍රී ලංකා දේශ සීමාව තුළ දේශීයව නිෂ්පාදිත ස්වභාවික වායු සඳහා ප්‍රමුඛත්වය ලබාදෙනු ඇත. එබැවින්, ස්වභාවික වායු ඕනෑම ස්වභාවයකින් ආනයනය කිරීම සඳහා සිදුකරනු ලබන ප්‍රසම්පාදන කටයුතු සහ ශ්‍රී ලංකාව සහ තෙවන පාර්ශවයක් සමඟ ඇතිකර ගනු ලබන කොන්ත්‍රාත්තු දේශීය ස්වභාවික වායු සම්පත් ගවේෂණය සහ වාණිජකරණය කිරීම ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතාව බව පිළිබිඹු වන අයුරින් සකස්කර ගත යුතු වේ. දේශීයව නිෂ්පාදනය කරනු ලබන ස්වභාවික වායු වාණිජ මට්ටමෙන් පවතින විට, ඒ සඳහා තරගකාරී වෙළඳපොළක් පැවතීම තහවුරු කරනු වස් ඕනෑම කාණ්ඩයකට ස්වභාවික වායු ආනයනය කිරීමේ කොන්ත්‍රාත්වල දී ඊට අදළ ප්‍රමාණය මිළ හා සැපයුම් කාලය පිළිබඳව සාකච්ඡා සම්මුති පැවැත්වීම සිදුකළ යුතු අතර අවශ්‍ය පරිදි සාකච්ඡා කිරීමට හැකිවන පරිදි අදළ විධිවිධාන ඇතුළත් කිරීම.

4.1.1.11 අදාළ කාර්යය භාරගනු ලැබ ඇත්තේ රාජ්‍ය අංශ නියෝජිතායතන හෝ පුද්ගලික අංශ පාර්ශ්වකරුවන් විසින් ද යන කරුණ නොසළකා, අමාත්‍යාංශය විසින් තාප අන්තර්ගතය හා සංයුතිය සම්බන්ධයෙන් පනවා ඇති හා පිළිගත් සහතිකකරණ ආයතන විසින් සහතික කරන ලද අවම ගුණාත්මක භාවය පිළිබඳ ප්‍රමිතීන් හා අනුගත වෙමින් රටේ පාරිසරික අවශ්‍යතාවයන් සපුරාලන්නා වූ ආනයන සැපයුම් සඳහා වූ ඉදිරිපත්වීම් පමණක් රජය විසින් අනුමත කළ යුතු ය.

4.1.2 යටිතල පහසුකම් සංවර්ධනය

4.1.2.1 ජාතික සංවර්ධන ප්‍රමුඛතාවයක් වශයෙන් රාජ්‍ය අංශ නියෝජිතායතන, පුද්ගලික අංශයේ සමාගම් හා/හෝ රාජ්‍ය - පෞද්ගලික අංශ සහයෝගිතා ව්‍යාපාර මගින් සිදුකරන ස්වභාවික වායු යටිතල පහසුකම් විෂයයෙහි ආයෝජනයක් සඳහා දිරිදීම, සක්‍රීය ලෙස ප්‍රවර්ධනය සහ ආයෝජකයින් සෙවීම රජය විසින් සිදු කරනු ඇත.

4.1.2.2 පවත්නා ශ්‍රී ලාංකික ප්‍රතිපත්ති, නීති හා නියමයන්, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා යහ පරිචයනට නිසි අවධානය යොමු කරමින් ස්වභාවික වායු/ද්‍රවිකෘත ස්වභාවික වායු/සම්පීඩ්‍ය ස්වභාවික වායු පිරිසැකසුම්කරණය, ද්‍රව ප්‍රතිවායුකරණය, වායුකරණය, ගබඩාකරණය, සම්පීඩනය, ප්‍රවාහනය හා බෙද හැරීම සහ පරිභෝජනයට අදළ සියළු යටිතල පහසුකම් ගොඩ නැගීම, සංවර්ධනය හා මෙහෙයුම් කටයුතු සඳහා බලය දීම, අධීක්ෂණය හා පසු විපරම් කිරීම රජය විසින් සිදු කරනු ඇත. මහා පරිමාන යටිතල පහසුකම් සම්බන්ධයෙන් ඒවායෙහි මෙහෙයුම් ආරම්භ කිරීමට ප්‍රථම ස්වාධීන වර්ගීකරණය සමාජ ආයතනයකින් සහතික කිරීම අවශ්‍ය වේ.

4.1.2.3 ඛනිජතෙල් විෂයය භාර අමාත්‍යාංශය රජය වෙනුවෙන් මෙම කාර්යයන් සිදු කිරීමේ වගකීම දරනු ඇත. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන් රජය විසින් හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති, නීති, නියමයන්, ප්‍රමිති හා යහ පරිචයනට අනුගත විය යුතු ය.

4.1.2.4 ස්වභාවික වායු වෙළඳපොළේ මධ්‍ය හා පසුගාමී අදියරයන්හිදී තරගකාරීත්වයක් ඇති කිරීම උදෙසා නල පද්ධතිය, ගබඩා ටැංකි. ලැබීමේ පර්යන්ත සහ ප්‍රතිවායුකරණ ඒකක ඇතුළත්ව අත්‍යවශ්‍ය යටිතල පහසුකම් තෙවන පාර්ශවයක් විසින් භාවිතයට ගැනීමට හැකිවන පරිදි විනිවිද භාවයක් සහිත හා වෙනස් කොට සැළකීමක් නැති ක්‍රමවේදයක් ශ්‍රී ලංකාවේ මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් සකස් කරනු ලබයි.

4.1.2.5 එවන් පහසුකම් ස්ථාපනය කිරීමේ දී අදළ ව්‍යාපාරයන්හි ක්ෂණික හා අනාගත ඉල්ලුම සහ මූල්‍ය හා ආර්ථික ශක්‍යතාවය වෙත නිසි සැලකිල්ල ලබාදෙමින් පහසුකම් පවත්නා ස්ථානය, පහසුකම් වර්ගය හා ධාරිතාවය සම්බන්ධයෙන් වඩාත් යහපත් විකල්පය තීරණය කරනු පිණිස පාරිසරික හා සාමාජීය බලපෑම් ඇගයීම ඇතුළත් සවිස්තරාත්මක යෝග්‍යතා අධ්‍යයනයන් සිදුකළ යුතු වේ. විවිධ තෝරා ගැනීම් හා විකල්ප ඇගයීමට ලක් කරමින් එවන් ව්‍යාපාරයනට අදළ වන්නාවූ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති නිර්ණායක භාවිතා කරමින් වඩාත් යෝග්‍ය විකල්ප තීරණය කළ යුතු වේ.

**4.1.3 පාරිසරික තිරසරභාවය**

4.1.3.1 රාජ්‍ය හා පෞද්ගලික අංශ පාර්ශ්වකරුවන් විසින් සිදුකරනු ලබන විදුලිබල උත්පාදන, ප්‍රවාහන, කාර්මික, ගෘහස්ථ හා ඉන්ධන සැපයුම් මෙහෙයුම්වල දී ස්වභාවික වායු පරිහරණයට අදළව සිදු කරන සියළු ඉදිකිරීම්, සංවර්ධන හා මෙහෙයුම් කටයුතු පරිසරයට අවම හානියක් සිදුවන බව තහවුරු කිරීම පිණිස ඒවා ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක පාරිසරික නීති, රෙගුලාසි හා ප්‍රමිතීන්ට අනුකූලව සිදු කෙරෙන බවට රජය විසින් සහතික වනු ඇත. තවමත් ශ්‍රී ලංකාව තුළ සලකා බැලෙන ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් නොවුන ද විශේෂයෙන් දේශගුණික විපර්යාස සහ හරිතාගාර වායු පාලනය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජාත්‍යන්තර අත්දැකීම් පිළිබඳව ද මෙහි දී අවධානය යොමු කරනු ලැබේ.

4.1.3.2 අදාළ සංවර්ධන කාර්යයන් ආශ්‍රිත පාරිසරික හානි අවම කරනු පිණිස සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් ආරක්ෂණ ක්‍රියාමාර්ග හා අනුගතවන බවට වගබලාගනු පිණිස අමාත්‍යාංශය විසින් අදාළ අවස්ථාවන්හි දී මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි අදාල නියාමන ආයතනයන්ගේ අදහස් විමසීම හා ඒවා සමග සම්බන්ධීකරණය සිදුකරනු ඇත. සුදුසු පරිදි මහජන අදහස් විමසීම් සිදු කොට එම අදහස් ද ශක්‍යතා අධ්‍යයන වාර්තාවට ඇතුළත් කෙරෙනු ඇත.

4.1.3.3 ඉදිකිරීම්, සංවර්ධන හා මෙහෙයුම් කටයුතු ආශ්‍රිතව පැනනැගිය හැකි පාරිසරික ගැටළු නිරාකරණය සඳහා දැනට පවත්නා ආරක්ෂණ ක්‍රියාමාර්ග (උදා :- නියාමනයන්, ප්‍රමිතීන් ආදිය) ප්‍රමාණවත් නොවන්නේ නම්, අදළ නියාමන ආයතනයන් විමසමින් හා ඒවායෙහි සහයෝගයෙන්, අමාත්‍යාංශය විසින් නව ආරක්ෂණ ක්‍රියාමාර්ග හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරනු ඇත.

4.1.3.4 සමුද්‍රික, වෙරළාශ්‍රිත හා භූමිගත පාරිසරික පද්ධති හා ඒවායෙහි සේවාවන් විෂයයෙහි සංකීර්ණ සම්බන්ධතාවයක් සහිත මහා පරිමාණ ස්වභාවික වායු සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් වන කල්හි, ක්‍රමෝපායික පාරිසරික ඇගයීමක් සිදුකරන ලෙස රජය විසින් එම ආයතන දිරිමත් කිරීම හා නියම කිරීම සිදුකරනු ඇත.

**4.1.4 මිළකරණය**

කර්මාන්තයේ වර්ධනය සඳහා ආයෝජන අවස්ථාවල තිරසාරත්වය හා ආකර්ෂණය තහවුරු කරමින් සැපයුම්කරුවන්ගේ ආයෝජන සඳහා ප්‍රමාණවත් ප්‍රතිලාභ ලබාදෙන බවට සහතික කරන අතරම පාරිභෝගිකයන් හට දැරිය හැකි මිළ ගණන් ඉදිරිපත් කෙරෙන බවට වගබලා ගැනීම ඉලක්ක කරගත් දේශීය මූලාශ්‍ර මෙන්ම ආනයනික ද්‍රවීකෘත ස්වාභාවික වායු සැපයුම් වර්ග දෙකම ආවරණය කරන්නා වූ ස්වභාවික වායු සම්බන්ධයෙන් සූත්‍රගත මිළ ප්‍රතිපත්තියක් රජය විසින් ක්‍රියාත්මක කරනු ඇත.

4.1.4.1 මිළකරණ ප්‍රතිපත්තිය පහත සඳහන් ප්‍රධාන තීරකයන් මත පදනම් වන අතර නමුත් ඒ මතම සීමා නොවනු ඇත.

- සැපයුම් පිරිවැය : නිෂ්පාදන, සම්ප්‍රේෂණ, ගබඩාකරණ, බෙදහැරීමේ පිරිවැය හා ආයෝජනය සඳහා සාධාරණ ප්‍රතිලාභයක් නිරූපණය කෙරෙන පරිදි වායු මිළකරණය කෙරේ.
- මිනුම් ලකුණු දර්ශක : දේශීය වායු මිළ ගණන් කලාපයේ පවත්නා මිළ ගණන් හා තරගකාරී වේ.[2]
- සැපයුම් දාමය ඔස්සේ වෙළඳාම ආශ්‍රිත ගනුදෙනු හේතුවෙන් පනවනු ලබන බදු, රාජ්‍ය භාගය හා ගාස්තු.
- ශ්‍රී ලංකා රජය විසින් ද්‍රවීකෘත ස්වභාවික වායු ගිවිසුම්වල ඇතුළත් කළ හැකි අනෙකුත් උපාය ක්‍රමික කොන්දේසි.

4.1.4.2 ඉහත ප්‍රකාශනයන් මගින් අවසන් පාරිභෝගිකයන් වෙත ළඟා වීමට පෙර විවිධ ප්‍රයෝජනයන් සඳහා පවත්නා දේශීයව නිෂ්පාදිත හෝ ආනයනික ස්වභාවික වායු මිළ ගණන් ව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය පොදු නියමයන් පෙළගස්වනු ලබයි. වායු විවිධ අංශයන් තුළ විවිධ ආකාරයන්ගෙන් ප්‍රයෝජනයට ගත හැකිය. උදා : චාලක බලශක්තිය (විදුලිබල උත්පාදනය, ප්‍රවාහනය හා කර්මාන්ත), තාප බලශක්තිය (නිවාස, කර්මාන්ත) හා අමුද්‍රව්‍ය (කර්මාන්ත), අවසන් පරිහරණය මත පදනම්ව ස්වභාවික වායු මිළ වෙනස්වනු ඇති අතර නිශ්චිත පරිහරණයන් සඳහා වායු මිළකරණය විවිධ පරිහරණයන් සඳහා වායු සැපයීම හා බෙද හැරීමට අදළව අංශ ප්‍රමුඛ කොටගත් පරාමිතීන් සමාලෝචනය මගින් තීරණය කෙරෙනු ඇත.

4.1.4.3 ස්වභාවික වායු වෙළඳපොළේ මධ්‍ය හා පසුගාමී කර්මාන්ත සඳහා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සේවා හා ස්වභාවික වායු මිළකරණය සඳහා විනිවිද භාවයෙන් යුතු හා සාධාරණ ක්‍රමයක් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසන් සභාව විසින් ගොඩනගනු ඇත. නියාමනයේ අරමුණු මිළ ගණන් පසු විපරම් කිරීමේදී සහ මිළ ගණන් පාලනයේ දී වෙනස් විය හැකි අතර එම අරමුණු සාක්ෂාත් කිරීම තහවුරු වන පරිදි ස්වභාවික වායු සැපයුම් දමය තුළ පිළිබිඹුවන නියාමන ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ.

4.1.4.4 ජීව වායුව හා ඒ ආශ්‍රිත ප්‍රභව ස්වභාවික වායු ජාලයට මුද හැරීමේ දී තීරු බදු පැනවීම හා වායු නිෂ්පාදනය කිරීම සඳහා පුනර්ජනනීය ප්‍රභවයක් භාවිතා කළ බවට ''සම්භවය පිළිබඳ සහතිකයක් '' ඉදිරිපත් කිරීමේ ක්‍රියා පිළිවෙතක් ගොඩනැගීම රජය විසින් සිදුකරයි.

[2] ශ්‍රී ලංකාව ඉතා කුඩා රටක් වන අතර වර්ධනය වෙමින් පවතින වෙළඳ පොළක් සහිත වේ. එබැවින් ශ්‍රී ලංකාවේ මිළ ගණන් මහා පරිමාණ පරිණත ආනයනකරුවන් සමඟ සංසන්දනය කිරීම කළ නොහැකිය.

**4.1.5 ආයතනික, නෛතික හා නියාමන රාමුව**

4.1.5.1 සමස්ත ස්වභාවික වායු අගය දමය සම්බන්ධ සියළු මෙහෙයුම් කටයුතු ආවරණය කරන්නා වූ ආයතනික ව්‍යුහය ද සමගින් දැනට පවත්නා නෛතික හා නියාමන රාමුව රජය විසින් සමාලෝචනය කරනු ඇත. සමාලෝචනයේ දී හඳුනාගනු ලබන අඩුපාඩුකම් මත පදනම්ව, වායු සැපයුම, ගබඩාකරණය, බෙදා හැරීම හා පරිභෝජනය හා සම්බන්ධ සියළු කටයුතු සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසන්නා වූ දේශීයව නිෂ්පාදිත හා ආනයනික ස්වභාවික වායු වර්ග ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය නව නෛතික විධිවිධාන මෙන්ම පවත්නා නීති හා රෙගුලාසි සඳහා වූ සංශෝධන ද හඳුන්වා දෙනු ඇත.

4.1.5.2 පවත්නා නීති සංශෝධනයේ දී හා නව නීතිමය විධිවිධාන සැකසීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කෙරෙනු ඇත ඃ

- ප්‍රවේශය බලගැන්වීම; ස්වභාවික වායු කර්මාන්තයේ පෙරගාමී, මධ්‍ය හා පසුගාමී කාර්යයන් හි නියැළීම සඳහා අවශ්‍ය බලපත්කරණය, අනුමැතීන් හා අවසරපත් ;

- ඉඩම් බදු දීම හා උපකරණ පිරිනැමීම ;

- ස්වෛරී මායිම් ආරවුල් ඃ රාජ්‍ය ආයෝජන ආරවුල්, වාණිජ ආරවුල්, මානව හිමිකම් හා පාරිසරික ආරවුල්, මිළකරණ ආරවුල්, හා යටිතල පහසුකම් හා ඉදිකිරීම් ආරවුල් ඇතුළත් වන, එනමුදු ඒවාට පමණක් සීමා නොවී ජාත්‍යන්තර කාර්ය පරිපාටීන් ප්‍රකාර හා ශ්‍රී ලංකාවේ නීතියට යටත්ව ආරවුල් නිරාකරණය ; සහ

- ශ්‍රී ලංකාවේ නීතිය යටතේ මැදිහත්කාරක සම්පාදනයන්ගෙන් හා ඒ ඒ තක්සේරුකරණ ක්‍රමයන්ගෙන් හා වන්දි ප්‍රමිතීන්ගෙන් පැන නගින හානි.

4.1.5.3 ස්වභාවික වායු කර්මාන්තයේ පෙරගාමී, මධ්‍ය සහ පසුගාමී කාර්යයන් හා ජීව වායු සම්පාදනය සම්බන්ධයෙන් වන ක්‍රියාකාරකම් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා දෘඩ නියාමන රාමුවක් රජය විසින් පිහිටුවනු ඇත. සෙසු කරුණු අතර, උද්ගාමී ඛනිජ තෙල් කර්මාන්තයේ සියළු කටයුතු නියාමනය ස්වභාවික වායු සහ අනෙකුත් කාණ්ඩ සඳහා ප්‍රවේශවීමේ අයිතින් අවසර පත් ලබා දීම, ප්‍රමිතීන් සැකසීම, මිල ගණන් තීරණය හා/හෝ අනුමත කිරීම, යටිතල පහසුකම් හා සේවා වෙත ප්‍රවේශය, පසු විපරම් කිරීම සහ මෙහෙයුම්කරුගේ වගකීම, අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සහ මෙහෙයුම් සඳහා ප්‍රවේශය, තරගකාරිත්වය, නියාමනය, කාර්ය සාධනය පසු විපරම් කිරීම, පාරිභෝගික පැමිණිලි හැසිරවීම , කර්මාන්ත ගැටළු නිරාකරණය සහ රජයට උපදෙස් ලබා දීම යනාදිය නියාමන විෂය පථයෙන් ආවරණය කෙරේ.

4.1.5.4 ස්වභාවික වායු වෙළඳපොළේ මධ්‍ය හා පසුගාමී යන අංශයන්හි නියාමනය කිරීම ශ්‍රී ලංකාවේ මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත පවරනු ලැබේ. ස්වභාවික වායු වෙළඳපොළේ මධ්‍ය හා පසුගාමී යන අංශයන්හි නියාමන යාන්ත්‍රණය මහජන උපයෝගීතා කොමිසම් සභාව විසින් ස්ථාපනය කරනු ලබන අතර එය උපදේශන මගින් ගොඩනගන ලද නීති පද්ධතියක් හා මාර්ගෝපදේශනයක් මගින් සිදු කරයි.

4.1.5.5 ශ්‍රී ලංකාවේ ස්වාභාවික වායු ආශ්‍රිත ව්‍යාපාර කළමනාකරණය හා ස්ථාපනය, ද්‍රවීකෘත ස්වභාවික වායු/ සම්පීඩිත ස්වභාවික වායු පහසුකම් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් ස්ථාපනය, ද්‍රවීකෘත ස්වභාවික වායු/සම්පීඩිත වායු කර්මාන්ත මෙහෙයුම් කිරීම සඳහා බලපත්‍ර/අවසර පත්‍ර ලබා දීම සහ ද්‍රවීකෘත ස්වභාවික වායු/සම්පීඩික ස්වභාවික වායු පහසුකම් නතර කිරීම සම්බන්ධයෙන් කටයුතු කෙරෙනු ඇත.

4.1.5.6 රජය වෙනුවෙන් වාණිජමය ශක්‍යතාවයන්ගෙන් යුත් ගවේෂණ හා නිෂ්පාදන කාර්යයන්හි නියැලීමට හැකි වන පරිදි දේශීය වායු ගවේෂණය හා නිෂ්පාදනය ද ඇතුළත් පෙරගාමී, මධ්‍ය සහ පසුගාමී අදියරයන්හි ව්‍යාපෘතීන්, දේශීය ස්වභාවික වායු නිෂ්පාදනය ගබඩාකරණය, නළ මාර්ග ප්‍රවාහන හා බෙදහැරීමේ යටිතල පහසුකම් සංවර්ධනය, හිමිකාරිත්වය හා මෙහෙයුම් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) මාදිලිවලින් ක්‍රියාත්මක වීම සඳහා එකම පිළිගත් ආයතනය වශයෙන් ''ජාතික වායු සමාගම'' නමින් වූ වෙනම සංස්ථාපිත ආයතනයක් රජය විසින් පිහිටුවනු ඇත.

4.1.5.7 අදාළ මූල්‍ය හා සෙසු නියාමන මිනුම් දඬු හා අනුගතව, 4.1.5.6 වගන්තියට අදාළ ව්‍යාපාරයන්හි නිරත අදාළ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන්ගේ මෙහෙයුම් ධාරිතාවය දක්වන්නා වූ ද්‍රවශීලතාවය, ආදායම්, ශුද්ධ ආදායම ශුද්ධ වත්කම් හා සෙසු අදාළ සංස්ථාපිත පරාමිතීන් පිළිබඳ අවම සීමාවන් රජය විසින් තීරණය කරනු ඇත.

4.1.5.8 කාර්යක්ෂම මෙහෙයුම්කරණය, බලගැන්වීම, පසුවිපරම් කිරීම හා ඇගයීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කරගනු පිණිස ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යොමුගත ප්‍රධාන ආයතනයන්හි කාර්ය භාරයන් හා වගකීම් පැහැදිළි ලෙස හඳුනා ගන්නා වූ කාර්යක්ෂම හා ඵලදායී ආයතනික රාමුවක් රජය විසින් ස්ථාපනය කරනු ඇත. එම ආයතනික රාමුව මගින් ප්‍රධාන වශයෙන් පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ඇත :

- මනා ක්‍රියාකාරිත්වය, අනුකරණයන් හෝ එකිනෙක ආයතනය අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම පිණිස ආයතනයන්හි කාර්ය භාරයන් හා වගකීම් හඳුනාගැනීම හා පැවරීම

- ආයතනික රාමුව තුළ පසුවිපරම් කිරීම හා ඇගයීම සඳහා සුහුරු මෙවලම්/යාන්ත්‍රණ හා දර්ශක ගොඩනැගීම

- නව සංවර්ධනයන් විසින් අවශ්‍ය කරන්නා වූ අතිරේක තොරතුරු අවශ්‍යතාවයන් කලින් කලට සමාලෝචනය කිරීම

- වායු අගය දමය තුළ කටයුතු කරන සියළු පරදුකරුවන් අතර පාරදෘශ්‍යභාවය හා වගවීම බලගැන්වීම.

4.1.5.9 ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය තුළ යෝජිත මැදිහත්කරණයන් කාර්යක්ෂමව හා නිසි කලට ක්‍රියාත්මක කෙරෙන බවට වගබලාගනු පිණිස, විදුලිබල, ප්‍රවාහන, කර්මාන්ත, ගෘහස්ථ හා වාණිජ යන සියළු ප්‍රධාන අංශයන්හි කටයුතු ආවරණය කරමින් වායු උපයෝගීකරණ ප්‍රධාන සැලැස්මක් සැකසීම හා කලින් කලට යාවත්කාලීන කිරීම සිදු කෙරෙනු ඇත.

**4.1.6 මෙහෙයුම් ආරක්ෂාව**

4.1.6.1 ජනතාව වෙත ආපදමය සිදුවීම් පිළිබඳ අවම අවදානමක් සහිතව අවම අපහසුතාවයක් ඇතිවන පරිදි ශ්‍රී ලංකාවේ නීති හා අනුගත වෙමින්, ස්වාභාවික වායු ගවේෂණය, පිරිසැකසුම්කරණය, ද්‍රාවීකෘතකරණය, ද්‍රාවීකෘත ස්වභාවික වායු පිරිපහදුව, ද්‍රවීකෘත ස්වභාවික වායු සම්ප්‍රේෂණය, ආනයනය, ප්‍රතිවායුකරණය, සම්පීඩනය, ගබඩාකරණය, බෙද හැරීම හා පරිභෝජනය යනාදී සියළු මෙහෙයුම් අදාළ දේශීය හා ජාත්‍යන්තර ආයතන හා වර්ගීකරණ ආයතන විසින් පළකර ඇති ඉහළම ආරක්ෂණ ප්‍රමිතීන් අනුව සිදු කෙරෙන බවට වගබලාගනු පිණිස රජය විසින් අවශ්‍ය වැඩ පිළිවෙල සකසනු ඇත. වර්තමනායේ දී උද්ගාමී ඛනිජතෙල් කර්මාන්ත කටයුතු වල ආරක්ෂණ නියාමනය ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ සහය ඇතිව ඛනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුව විසින් නියාමනය කරනු ලැබේ. ස්වභාවික වායු වෙළදාම සම්බන්ධයෙන් වන මධ්‍ය හා පසු ගාමී කටයුතු සම්බන්ධයෙන් වන ආරක්ෂණ නියාමනය ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම වෙත පවරනු ලැබේ.

4.1.6.2 මේ සඳහා අදාළ පාර්ශවයන් පහත සඳහන් කරුණු හා අනුගත විය යුතුවනු ඇත.

- ඉංජිනේරු පිරිවැය ඇස්තමේන්තුව ඇතුළු විස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනය, ඉංජිනේරුකරණය, ප්‍රසම්පාදනය හා ඉදිකිරීම, ක්‍රියාවට නැංවීමේ බලය පැවරීම, මෙහෙයුම්කරණය හා නඩත්තු සහ ක්‍රියාවට නැංවීමේ බලය නැවත ඉවත්කර ගැනීම ඇතුළත් ව්‍යාපෘති සැපයුම් ජාලයට අදාළ වන්නාවූ කාර්යයන් පිළිබඳ සවිස්තරාත්මක සෞඛ්‍ය, පාරිසරික හා ආරක්ෂණ බලපෑම් ඇගයීමක් සිදු කිරීම.

- ආපදවන්, අපේක්ෂා කළ හැකි හදිසි අනතුරු තත්ත්වයන්, ඵල විපාක හා අදාළ ශක්‍යතාවයන් හඳුනාගෙන, ඇගයීමකට ලක් කොට තක්සේරු කරනු පිණිස ප්‍රමාණාත්මක අවදානම් තක්සේරුකරණයක් සිදු කිරීම.

- ආසන්න ප්‍රදේශවල සහ ශ්‍රී ලාංකීක ජල තීරයන්හි කටයුතුවල යෙදෙන ජනතාව, දේපළ සහ පරිසරය ආරක්ෂා කරනු වස් අවදානම් තක්සේරු අධ්‍යයනයන් සිදු කිරීම.

- සම්ප්‍රේෂණය, ගබඩාකරණය, බෙද හැරීම හා උපයෝජනය හා සම්බන්ධ යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ, නළ මාර්ග පද්ධති, පාරිභෝගික ස්ථාපනයන් මෙහෙයවන සියල්ලන් සඳහා පුහුණුව ලබාදීම.

- දේශීය වශයෙන් නිෂ්පාදිත හා ආනයනික ස්වභාවික වායු වර්ග මෙහෙයුම්කරුවන් හට අවසරපත් නිකුත් කිරීම සඳහා කටයුතු සම්පාදනය

- ජාත්‍යන්තර අවශ්‍යතා හා සමුද්‍රීය ප්‍රමිතීන් ප්‍රකාර සෑම ස්වභාවික වායු මෙහෙයුම් ස්ථාපනයකම ආරක්ෂක කළාප ස්ථාපනය කිරීම හා ඒවා ප්‍රකාශයට පත් කිරීම.

- ස්වභාවික වායු මෙහෙයුම්හි හානිකර බලපෑම වැළැක්වීම හා සමනය සඳහා ආපද කළමනාකරණ පද්ධති ස්ථාපනය.

- ආපදා අවස්ථාවන්හි දී සේවකයන්, පරිහරණය කරන්නන් මෙන්ම බලපෑමට ලක්වූ තුන්වන පාර්ශ්වයන් ද ඇතුළත් හානියට පත් පාර්ශ්වයන් ආවරණය පිණිස සුදුසු රක්ෂණාවරණ ක්‍රම ලබා ගැනීම.

4.1.6.3 රජය විසින් අවශ්‍ය සෑම තැනකදීම, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් අනිවාර්ය අනුකූලතාවය ක්‍රියාත්මක කරනු පිණිස, රට තුළ පවත්නා දේශීයව නිෂ්පාදිත හා ආනයනික ස්වභාවික වායු වර්ග, ගබඩාකරණ පර්යන්ත, ස්වභාවික වායු ප්‍රවාහනය සඳහා තැනූ නළ මාර්ග හා පාරිභෝගිකයන් වෙත ස්වභාවික වායු බෙදා හැරීම පිණිස සැකසූ නළ මාර්ග පද්ධතීන්හි ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ප්‍රමිතිගත පිරිවිතරයන් හඳුන්වාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

4.1.6.4 ශ්‍රී ලංකා රජය විසින් පිළිගෙන නිර්දේශ කරන ලද වලංගු ආරක්ෂණ ක්‍රියාමාර්ග හා අනුගත වීමකින් තොරව දේශීයව නිෂ්පාදිත හෝ ආනයනික ස්වභාවික වායු පද්ධතියක් කිසිදු පුද්ගලයෙකු විසින් ක්‍රියාත්මක කරනු ලැබීම වරදක් බවට පනවමින්, ආරක්ෂක පැතිකඩයන් ආවරණය කෙරෙන පරිදි රජය විසින් අවශ්‍ය නීතිමය විධිවිධාන හා රෙගුලාසි හඳුන්වාදෙනු ඇත.

4.1.6.5 දේශීයව නිෂ්පාදිත හෝ ආනයනික ස්වභාවික වායු පහසුකම් ස්ථානගත කර ඇති මහ නගර සහා හෝ වෙනත් ප්‍රාදේශීය බල ප්‍රදේශයක ගිනි ආරක්ෂණ පහසුකම් බඳු පොදු ආරක්ෂණ පහසුකම් හා යටිතල පහසුකම් ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ද රජය විසින් ගනු ඇත.

**4.1.7 පරිභෝජනය, ප්‍රවර්ධනය හා වෙළඳපොළ සංවර්ධනය**

4.1.7.1 විදුලිබලය උත්පාදනය, කර්මාන්ත, ප්‍රවාහන, ගෘහස්ථ හා වාණිජ ආයතනයන්හි තාප යෙදවුම්, හා කාර්මික නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යයක් (උදා : පොහොර, මෙතනෝල්, එතනෝල් හා ෆෝමල්ඩිහයිඩ්) ආදී වශයෙන් විවිධ ආර්ථික ප්‍රයෝජනයන් සඳහා ස්වභාවික වායු යොදා ගැනීම දිරිගැන්වීම හා සක්‍රීය ලෙස ප්‍රවර්ධනය ද රජය විසින් සිදු කරනු ඇත.

4.1.7.2 මෙම කරුණු සාක්ෂාත් කරගනු පිණිස ස්වභාවික වායු ව්‍යාපාරයෙහි ශ්‍රී ලාංකික ආයතනයන්ට එලදයී ලෙස නිරතවීමේ හැකියාව ලබාදෙමින්, ස්වභාවික වායු සඳහා තරගකාරී හා කාර්යක්ෂම දේශීය හා අපනයනික වෙළඳපොළවල් ස්ථාපනයට අවශ්‍ය පහසුකම් ලබාදීමේ ක්‍රමෝපායික ක්‍රියාමාර්ග ගනු ඇත. ඒ අනුව, විවිධ අංශයන් තුළ ස්වභාවික වායු පරිහරණය ප්‍රවර්ධනය පිණිස පහත ක්‍රියාමාර්ග ගනු ඇත.

- ස්වභාවික වායු භාවිතය වෙත වේගවත් විතැන්වීමක් ඇති කරනු පිණිස, වාහන ද ඇතුළත්ව වායුවලින් ක්‍රියාත්මක වන්නා වූ යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ ආනයනය සඳහා ස්වභාවික වායු භාවිතා කරන කර්මාන්ත වෙත තීරුබදු හා අනෙකුත් බදු සහන ලබාදීම.

- සිය තාප බලශක්ති උත්පාදන ඒකකයන් ඛනිජතෙල්වලින් ස්වභාවික වායු වෙත මාරු කිරීමට කැමැත්තක් දක්වන්නාවූ කර්මාන්තකරුවනට අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යමය සහයෝගය ලබාදීම.

- අදළ රජයේ නියෝජිතායතන මගින් තාක්ෂණික සහාය ලබාදෙමින් ස්වභාවික වායුවලට මාරු වීමේ තාක්ෂණය අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම.

- වෙනත් ෆොසිල ඉන්ධන වෙතින් විතැන් වීමේ අභිලාෂයෙන් පසුවන පාරිභෝගිකයන් හට දේශීයව නිෂ්පාදිත හා ආනයනික ස්වභාවික වායු වර්ග සැපයුම සඳහා අවශ්‍ය නීතිමය හා ආයතනික සහාය, ආරක්ෂක මාර්ගෝපදේශ හා පොදු භෞතික යටිතල පහසුකම් ගොඩනැගීම.

- ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම යටතේ ස්වභාවික වායු බෙදා හැරීම හා වෙළඳාම සිදු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ධෛර්යමත් කිරීම.

4.1.7.3 තරගකාරිත්වය හා පෞද්ගලික අංශ සහභාගිත්වය ප්‍රවර්ධනය කරන්නාවූ සුදුසු ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ විවිධ ආර්ථික අංශයන්හි ස්වභාවික වායු සැපයුම් දමය මෙන්ම ස්වභාවික වායු වෙළඳපොළවල විවෘත හා තරගකාරී වෙළඳ ආකෘතීන් සංවර්ධනය රජය විසින් නිරතුරුව දිරිගන්වනු ඇත.

4.1.7.4 පාරිභෝගිකයන්, වෙනත් වෙළඳපොළ ක්‍රියාකරුවන් හා මහජනතාව වෙත අවාසි සහගත අයුරින් බලවත් ක්‍රියාකරුවන් කිහිප දෙනෙකු අත වෙළඳපොල බලය කේන්ද්‍රගත වීම හා ඒකරාශි වීම වළකනු පිණිස ස්වභාවික වායු සැපයුම් දමයේ පෙරගාමී, මධ්‍ය හා පසුගාමී අංශයන්හි නිරත නියාමන ආයතනවල සහයෝගය සහිතව හා රජය සතු ක්‍රියාත්මක හා යෝජිත කාර්මික මෙහෙයුම්කරුවන්ගේ සක්‍රීය මෙහෙයුම් සහාය සහිතව, අවශ්‍යයැයි හැඟෙන ඕනෑම අවස්ථාවක දී අමාත්‍යාංශය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත.

### 4.1.8 ධාරිතා හා දේශීය වටිනාකම් සංවර්ධනය

4.1.8.1 ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් ස්වභාවික වායු කර්මාන්තයේ පෙරගාමී, මධ්‍ය හා පසුගාමී ක්‍රියාකාරකම් හි ජාතික ධාරිතාවයේ සාධනීය සංවර්ධනයක් අපේක්ෂා කරනු ලබයි. සේවා නියුක්තිය, තාක්ෂණික දැනුම හා කළමනාකරණ කුසලතාවය හා නිෂ්පාදන ප්‍රාග්ධන සම්පත් යන ආකාරයන්ගෙන් ශ්‍රී ලාංකිකයන් සඳහා අවස්ථාවන් විවර කරනු පිණිස ආයෝජකයන්, සංවර්ධකයන්, කොන්ත්‍රාත්කරුවන්/උප කොන්ත්‍රාත්කරුවන්, තාක්ෂණික ප්‍රවීණයන් ආදී වශයෙන් කර්මාන්තයේ ප්‍රධාන පරදුකරුවන් සමඟ ප්‍රවර්ධිත සහයෝගයක් මගින් මෙම අරමුණ සාක්ෂාත් කරගැනෙනු ඇත.

4.1.8.2 4.1.7.2 වගන්තිය තුළ යෝජිත පරිදි සුදුසු දිරිමත්කරණ යෝජනාක්‍රම පිරිනැමීම මගින් දේශීය වශයෙන් අමුද්‍රව්‍යයක් හා බලශක්ති මූලාශ්‍රයක් වශයෙන් වායු පරිහරණය කරන කර්මාන්ත ස්ථාපනය දිරිගැන්වීමෙන් ස්වභාවික වායු කර්මාන්තයේ දේශීය නියැලීම් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග රජය විසින් ගනු ඇත. එවන් යෝජනාක්‍රම මගින් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය , දේශීය ප්‍රජාවන්ගේ නිෂ්පාදන කුසලතාවයන් නංවාලීම, දේශීය ව්‍යවසායකයන් සඳහා ව්‍යාපාරික අවස්ථාවන් ඇති කිරීම, දේශීය ව්‍යාපාරයන්හි තරගකාරිත්වය වර්ධනය කිරීම, දේශීය යටිතල පහසුකම් සංවර්ධනය හා දේශීය ආයතනයන්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම ඉලක්කගත කරනු ඇත.

4.1.8.3 නාවික, බලශක්ති, යාන්ත්‍රික හා ප්‍රවාහන යනාදී ක්‍රියාකාරකම් සම්බන්ධ වන විශේෂිත වූ සේවාවන් කර්මාන්තවල සහාය රටේ ක්‍රියාකාරී ස්වභාවික වායු කර්මාන්තයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වේ. දේශීය වශයෙන් සංවර්ධනයට අත්‍යවශ්‍ය සාධකයන් ලෙස අතිරේක සේවා/කර්මාන්ත සමූහය ගොඩනැංවීම සහ සංවර්ධන සඳහා පහසුකම් සැපයීමට අවශ්‍ය උපකාරක කාර්යයන් රජය විසින් හඳුන්වා දෙයි.

4.1.8.4 දේශීය ප්‍රජාවන් සමගින් යම් ප්‍රතිලාභ බෙදා ගනිමින් ව්‍යාපාරයන්හි සමාජ ස්ථාවරත්වය හා පිළිගැනීම නංවාලනු පිණිස දේශීය වශයෙන් ප්‍රමුඛතාගත ප්‍රජා සංවර්ධන වැඩසටහන් දියත් කිරීමට කර්මාන්ත පරදුකරුවන් දිරිගැන්වෙනු ඇත.

4.1.8.5 මෙයට අමතරව, පහත සඳහන් ක්ෂේත්‍රයන්හි ඉලක්කගත රාජ්‍ය මැදිහත්කරණයන් මගින් ජාතික ධාරිතාවය ඉහළ නැංවෙනු ඇත.

- ස්වභාවික වායු කර්මාන්තයේ නියැළි ශ්‍රී ලාංකිකයන් හට අවශ්‍ය කාර්මික හා කළමනාකරණ කුසලතාවයන් ලබාදීම සඳහා දේශීය විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා අදාළ සහතිකකරණ ආයතන බලගැන්වීම.

- වායු කර්මාන්තය පිළිබඳ අධ්‍යාපනය, පර්යේෂණ හා දත්ත හා තොරතුරු හුවමාරුව විෂයයෙහි ජාත්‍යන්තර සහයෝගය සඳහා පහසුකම් සැලසීම.

- උපාධි අපේක්ෂකයන්, පශ්චාත් උපාධි අපේක්ෂකයන්, පශ්චාත් ආචාර්ය උපාධි අපේක්ෂකයන් හා වෘත්තීය පුහුණුලාභීන් සඳහා සීමාවාසික අවස්ථාවන් සම්පාදනය සඳහා ආයෝජකයන් හා සංවර්ධකයන් සමඟ කටයුතු කිරීම.

- තාක්ෂණ හා කළමනාකරණ දැනුම, කුසලතා හා නවෝත්පාදනයන් ප්‍රවර්ධනය පිණිස රාජ්‍ය පෞද්ගලික අංශ හවුල්කාරිත්වය සහිතව ස්වභාවික වායු කර්මාන්තය පිළිබඳ විශිෂ්ටත්වයේ කේන්ද්‍රයක් ස්ථාපනය කිරීම, මෙම කාර්යයේ දී ස්වභාවික වායු කර්මාන්තයේ තාක්ෂණික, මූල්‍ය, නෛතික හා සෞඛ්‍යමය, ආරක්ෂක හා පාරිසරික සාධක සම්බන්ධ ප්‍රමාණවත් අත්දැකීම් සහිත ශ්‍රී ලාංකිකයන් ඇතුළුව ඛනිජ තෙල් කර්මාන්තයේ දැනට විදේශගත රැකියාවල නිරත පුද්ගලයන්ගේ ද සහභාගිත්වය ලබා ගැනෙනු ඇත.

- අගය දාමයේ විවිධ අදියරයන්හි කටයුතු කරන කර්මාන්තයේ බහුවිධ පරදුකරුවන්ගෙන් තොරතුරු ලබාගන්නා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මත පදනම් වූ සවිස්තරාත්මක ස්වභාවික වායු තොරතුරු පද්ධතියක් ස්ථාපනය කොට සංවර්ධනය කිරීම, තොරතුරු පද්ධතිය නිතිපතා යාවත්කාලීන කොට සැලසුම්කරණය, ප්‍රතිපත්ති සංවර්ධන හා කළමනාකරණ අරමුණු සඳහා භාවිතා කෙරෙනු ඇත.

- අළුත්වැඩියා හා නඩත්තු කටයුතු බඳු උපකාරක සේවාවන්හි දී දේශීය නිපුණතාවයන් සංවර්ධනය කිරීම.

- සංවර්ධන කටයුතු සඳහා කැපවීමේ හැඟීමක් ඇතිකරගනු පිණිස ස්වභාවික වායු කර්මාන්තයේ සංවර්ධන කාර්යයන් පිළිබඳ ජනතාව වෙත දැනුම් දීම සඳහා ඵලදායී සන්නිවේදන උපාය මාර්ගයක් ගොඩනැගීම.

- පෙරගාමී, මධ්‍ය සහ පසුගාමී ඛනිජතෙල් කර්මාන්තයේ තිරසර සංවර්ධනය සඳහා භාවිතා කරනු පිණිස රටට ආනයනය කරනු ලබන හෝ රටින් අපනයනය කරනු ලබන ද්‍රවීකෘත ස්වභාවික වායු සඳහා නාමික තීරු බද්දක් පැනවීම හෝ නාමික ගාස්තුවක් අය කිරීම.

- දේශීය ධාරිතාවයන් හා නිපුණතාවයන් සංවර්ධනය කිරීමෙහි ලා උපාය මාර්ගික ලෙස සහභාගිවනු පිණිස ජාතික වායු සමාගම ශක්තිමත් කිරීම.

**4.2 ප්‍රධාන ආර්ථික අංශයන්හි ස්වභාවික වායු භාවිතය සම්බන්ධයෙන් ඇති ආංශික ගැටළු නිරාකරණය සඳහා වන ප්‍රතිපත්ති.**

එළැඹෙන වර්ෂයන්හි දී ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථිකයේ අංශ කිහිපයක් තුළ ස්වභාවික වායු භාවිතයේ සාධනීය වර්ධනයක් ශ්‍රී ලංකාවට අපේක්ෂා කළ හැකිය. ප්‍රථමයෙන්ම බලශක්ති අංශය ස්වභාවික වායු භාවිතයට යොමුවනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඉන්පසු ක්‍රමානුකූලව කර්මාන්ත (ඉන්ධනයක් වශයෙන් හා අමුද්‍රව්‍යයක් වශයෙන් යන දෙකම) ප්‍රවාහන සහ ගෘහස්ථ හා වාණිජ අංශ වෙත විතැන්වෙනු ඇත. ස්වභාවික වායු ඒ ඒ තනි අංශය සඳහා භාවිතා කිරීම තුළ සියළු අංශයන් හරහා යොදගනු ලබන පොදු ප්‍රතිපත්ති මගින් නිරාකරණය කළ නොහැකි විවිධ තාක්ෂණික හා කළමනාකරණ ගැටළු අන්තර්ගත වේ. ඒ ඒ අංශ සඳහා සුවිශේෂී වූ ගැටළු නිරාකරණය කරනු පිණිස ප්‍රතිපත්ති සම්පාදනයේ අවශ්‍යතාවය ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් හඳුනාගනු ලබයි. ඒ අනුව, විදුලිබල උත්පාදනය, ප්‍රවාහනය, කර්මාන්ත, ගෘහස්ථ හා ඉන්ධන සැපයුම් අංශයන්හි ස්වභාවික වායු භාවිතයට අදළ ප්‍රතිපත්ති ප්‍රකාශන මෙම කොටස තුළින් ඉදිරිපත් කෙරේ.

4.2.1 විදුලිබල, ප්‍රවාහන, කර්මාන්ත හා ගෘහස්ථ අංශයන්හි ස්වභාවික වායු භාවිතය

4.2.1.1 රජය විසින් පහත සඳහන් ක්ෂේත්‍රයන් මත අවධානය යොමු කරමින් විදුලිබල, ප්‍රවාහන, කර්මාන්ත හා ගෘහස්ථ සහ වාණිජ ක්ෂේත්‍රයන්හි ස්වභාවික වායු පරිහරණය හඳුන්වාදීමේ හා ප්‍රවර්ධනය කිරීමේ ශක්‍යතාව ක්‍රමානුකූලව තක්සේරු කිරීම උදෙසා ක්‍රියාමාර්ග ගනු ඇත.

- ඒ ඒ ක්ෂේත්‍රයේ බලශක්ති පරිහරණය පිළිබඳ වර්තමාන පැතිකඩ හා ස්වභාවික වායු කරා විතැන්වීමෙන් ඇතිවන වාසි සහ ඒ සඳහා නම්‍යතාවය.

- බලශක්ති යෙදවුම් හා/හෝ කාර්මික යෙදවුම් මූලාශ්‍රයක් වශයෙන් ස්වභාවික වායු හඳුන්වාදීමේ විෂයයෙහි ඒ ඒ අංශයට සුවිශේෂි වූ යටිතල පහසුකම් සංවර්ධන අවශ්‍යතා.

- වර්තමාන බලශක්ති මූලාශ්‍රය වෙතින් ස්වභාවික වායු වෙත විතැන්වීම සඳහා විවිධ අංශයන්ගේ පවත්නා තාක්ෂණය හා ධාරිතා සංවර්ධන අවශ්‍යතා.

- එම විතැන්වීම සිදු කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ පරදුකරුවන් වෙතින් අපේක්ෂිත නිශ්චිත කාර්ය භාරයන්, අදළ ක්‍රියාකාරිත්ව ක්ෂේත්‍ර හා ආයෝජන පරිමාණය

- වර්තමාන බලශක්ති මූලාශ්‍රයෙන් ස්වභාවික වායු වෙත විතැන් වීම සඳහා අවශ්‍ය ආයෝජනයන් සිදු කිරීමට ඒ ඒ අංශයන්හි රාජ්‍ය හා පෞද්ගලික අංශ පරදුකරුවන්ගේ පවත්නා කැමැත්ත හා ධාරිතාවය.

- විවිධ අංශයන්හි ස්වභාවික වායු කරා මාරු වීම ආශ්‍රිත ප්‍රධාන පාරිසරික හා සමාජ ආර්ථික බලපෑම්.

- ඒ ඒ අංශයන්හි (උදා : චාලක ශක්තිය, තාප බලශක්තිය, කාර්මික යෙදවුම් ලෙස) ස්වභාවික වායු පරිහරණයේ විවිධ ස්වරූපයනට අදාළ සෞඛ්‍ය හා ආරක්ෂක ප්‍රමිතීන්.

- වර්තමාන බලශක්ති මූලාශ්‍රයේ සිට ස්වභාවික වායු වෙත විතැන් වීම හේතුකොට ඇතිවන මාරුවීමේ පිරිවැය හා විතැන්වීමේ විභවීය ප්‍රතිලාභ පිළිබඳ සංසන්දනාත්මක තක්සේරුව.

4.2.1.2 එවන් තක්සේරුවල ප්‍රතිඵලය මත පදනම්ව, 4.1.7.2 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ යෝජිත පරිදි සුදුසු දිරිගැන්වීමේ යෝජනාක්‍රම ලබදෙමින් ක්‍රමෝපායිකව තෝරාගත් අංශ හා ක්‍රියාකාරකම්හි ස්වභාවික වායු පරිහරණය ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

4.2.1.3 4.1.5.9 ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ යෝජිත වායු උපයෝගිතා ප්‍රධාන සැලැස්ම මගින් විදුලිබල, ප්‍රවාහන, කර්මාන්ත හා ගෘහස්ථ සහ වාණිජ අංශයන්හි ස්වභාවික වායු භාවිතය ප්‍රවර්ධන සඳහා අවශ්‍ය අත්පත් කරගත හැකි ආසන්න කාල රාමු සහිත (වසර පහක් වූ) ඒ ඒ අංශවලට අදළ ක්‍රියාමාර්ග හා උපාය මාර්ගික මැදිහත්කරණයන් හා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා සමාන්තරව යමින් අනාගත සංවර්ධන ව්‍යාපෘති මත පදනම් වූ ස්වභාවික වායු උපයෝජනය හෝ ප්‍රවර්ධනය සඳහා වූ දිගු කාලීන ප්‍රක්ෂේපණයන් ආවරණය කෙරෙනු ඇත. වායු උපයෝගීතා ප්‍රධාන සැලැස්ම සෑම අවුරුදු පහකට වතාවක් සමාලෝචනය කරනු ලැබේ.

4.2.1.4 ඒ ඒ අංශ ප්‍රමුඛ කොටගත් ප්‍රතිපත්තිමය මැදිහත්වීම් වඩාත් අවශ්‍යවන ක්ෂේත්‍රයක් විය හැකි බැවින් විවිධ පරිහරණයන්/අංශ සඳහා ස්වභාවික වායු, බෙදහැරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරෙනු ඇත. අමාත්‍යාංශයේ නියමය හා මග පෙන්වීම යටතේ, යෝජිත ජාතික වායු සමාගම හා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින්, ස්වභාවික වායු භාවිත කරන්නන් සඳහා ස්වභාවික වායු බෙදහැරීමේ කාර්යයෙහි නිරතවීමට අපේක්ෂා කරන රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයෝජකයන් වෙත තාක්ෂණික සහාය හා ආයතනික සහයෝගය ලබා දෙමින් රට තුළ ස්වභාවික වායු බෙදහැරීම සම්බන්ධයෙන් වන කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

4.2.1.5 4.2.1.4 කොටස තුළ යෝජිත සහයෝගී වැඩපිළිවෙල මගින් ස්වභාවික වායු බෙදහැරීමේ පහත ක්ෂේත්‍ර මත අවධානය යොමු කරනු ඇත.

- පරිසර හානි අවම කරමින් හා අවම ආපද අවදනම් සහතිව ජනතාව වෙත අවම අපහසුතාවයක් සිදුවන පරිදි ස්වාභාවික වායු සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන භාවිත කරන්නන්/අංශ වෙත නිසි කලට හා බාධාවකින් තොරව සැපයුම් සිදුකරන බවට වගබලා ගැනීම.

- නළමාර්ග එළීම, වායු සම්පීඩක මධ්‍යස්ථාන, සම්පීඩක වායු පිරවුම්හල්, ගබඩාකරණ හා වෙනත් පහසුකම් ඇතුළත් බෙදහැරීමේ පහසුකම් ඉදිකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය හා මග පෙන්වීම ලබාදීම.

- බෙදහැරීමේ කාර්යයන් සිදුකිරීම සඳහා අදළ බලධිකාරීන් වෙතින් අවශ්‍ය අනුමැතීන් හා බලපත් ලබා ගැනීමට සහාය වීම.

- මාර්ග, දුම්රිය මාර්ග හා වායු ප්‍රවාහන මාර්ග මතින් ස්වභාවික වායු (සම්පීඩිත ස්වභාවික වායු/ද්‍රවීකෘත ස්වභාවික වායු) බෙදහැරීම සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීම හා ගබඩාකරණ ටැංකිවල පවත්නා තොග නඩත්තු කිරීම අනුමත කිරීම හා අධීක්ෂණය.

- ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි සිට කර්මාන්ත කළාප, නිවාස යෝජනාක්‍රම හා ඉන්ධන බෑහැර කිරීමේ මාර්ග හා ප්‍රාදේශීය නළමාර්ග පද්ධති දක්වා වූ ප්‍රධාන පාරිභෝගික ලක්ෂ්‍යයන්හි සිට තනි පාරිභෝගිකයන් දක්වා ස්වභාවික වායු බෙද හැරීම නියාමනය.

- අවදනම් අවම කිරීම සඳහා අවශ්‍ය අවදනම් පූර්වාරක්ෂක ක්‍රියාමර්ග හා පවත්නා අවදනම් තත්ත්වයන් පිළිබඳව ප්‍රාදේශීය ජාලයන් හරහා නළ මාර්ග මගින් සැපයීම් සිදු කෙරෙන පාරිභෝගිකයන් වෙත මහජන දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.

- ට්‍රක්රථ මගින් හෝ නළ මාර්ගයන්ගෙන් වායු බෙදහැරීම් කටයුතු සිදුකරන පිරිස් වෙත ආරක්ෂක ප්‍රමිති පිළිබඳව අනිවාර්ය පුහුණු ලබාදෙන බවට වගබලා ගැනීම හා මෙහෙයුම්කරුවන් විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ හා අනුගමනය කළයුතු මාර්ගෝපදේශ සහ නිල කාර්ය පටිපාටි සැකසීම.

- ස්වභාවික වායු මගින් දිවෙන වාහන සඳහා ඉන්ධන සැපයුම පිණිස අධිවේගී මාර්ග ද ඇතුළත් ප්‍රධාන මාර්ග දිගේ ස්වභාවික වායු (සම්පීඩිත වායු, ද්‍රවීකෘත ස්වභාවික වායු ආදී) එහි ඕනෑම වර්ගයක් සපයන ඉන්ධන පිරවුම්හල් ස්ථාපනය අනුමත කිරීම හා අධීක්ෂණය

**4.2.2 නැව්තෙල් සැපයුම හා අපනයනයන්**

4.2.2.1 ඉන්ටනැෂනල් මැරිටයිම් සංවිධානය විසින් පනවන ලද 2020 අඩු සල්ෆර් භාවිත කිරීමේ රෙගුලාසිය මගින් පෙන්වා දෙන පරිදි ප්‍රධාන කොටම පාරිසරික කරුණු කාරණා හා විමෝචනයන් අවම කිරීමේ අවශ්‍යතා හේතුකොට ද්‍රවීකෘත ස්වභාවික වායු භාවිතයෙන් මුහුදු යාත්‍රා ක්‍රියාත්මක කිරීම නැව් කර්මාන්තය තුළ නැගී එන ප්‍රවණතාවයක් වේ. ද්‍රවීකෘත ස්වභාවික වායු මගින් ක්‍රියාත්මක වන යාත්‍රාවනට සේවය සැලසීමේ ද්‍රවීකෘත ස්වභාවික වායු ඉන්ධන සැපයුම් පහසුකම් විෂයයෙහි මෙකී ප්‍රවනතාවයෙහි ප්‍රතිඵලයක් වශයෙන් විවරවන වෙළෙඳපොළ අවස්ථාව හිමිකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග රජය විසින් ගනු ඇත.

4.2.2.2 රාජ්‍ය, පෞද්ගලික හෝ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය වැඩ පිළිවෙලයන් යටතේ දේශීයව නිෂ්පාදිත හෝ ආනයනික ද්‍රවීකෘත ස්වභාවික වායු නාවික යාත්‍රා සඳහා භාවිතයේ දී පහසුකම් සලසනු වස් අදාළ වරායන්වල ඉන්ධන සැපයුම් පහසුකම් ස්ථාපනය සඳහා අවශ්‍ය දිරිගැන්වීම හා පහසුකම් සැලසීම රජය විසින් සිදු කරනු ඇත.

4.2.2.3 ද්‍රවීකෘත ස්වභාවික වායු අපනයන නිෂ්පාදනයක් වශයෙන් අනෙකුත් රටවලට අලෙවි කිරීම හෝ නැව් තෙල් ලබා ගැනීම සඳහා පැමිණෙන නැව්වලට සැපයීම සම්බන්ධයෙන් වන අවස්ථාවල දී කලාපයේ පවතින් මිළ ගණන් හා තරගකාරී වෙමින් ජාත්‍යන්තර දර්ශක පදනම්කර ගනිමින් මිළ ගණන් තීරණය කරනු ලැබේ.

**5. යොදගැනීම හා විෂය පථය**

ජාතික වායු ප්‍රතිපත්තියේ විෂය පථය දේශීය නිෂ්පාදන හා ආනයනික ස්වභාවික වායු සැපයුම්වල ස්වභාවික වායු අගයදමයේ පෙරගාමී, මධ්‍ය හා පසුගාමී අදියරයන් හි මැදිහත් වීම සම්පූර්ණයෙන් ආවරණය කරනු ලබයි. කෙසේ වෙතත්, දේශීය සම්පත් ගවේෂණය හා සංවර්ධනය යන පෙරගාමී කටයුතු සඳහා මඟපෙන්වීමක් අනෙකුත් ප්‍රතිපත්ති මගින් ද විස්තරාත්මකව සිදු කරයි. එබැවින්, මෙම ජාතික ප්‍රතිපත්තියේ විෂය පථය තුළ වායු සැපයීම, පිරිසැකසුම, ද්‍රවීකෘතකරණය, ප්‍රවාහනය, ගබඩාකරණය, ප්‍රති වායුකරණය, බෙදහැරීම හා වෙනත් අනුපූරක සේවාවන් සම්බන්ධ වන ස්වභාවික වායු අගයදමයේ මධ්‍ය හා පසුගාමී සබඳතාවන් පිළිබඳව වඩාත් අවධානය යොමු කෙරේ.

**6. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

ජාතික වායු ප්‍රතිපත්තියේ ප්‍රතිපත්තීමය ඉලක්කවලට සාර්ථකව ළඟාවීම, යෝජිත ප්‍රතිපත්තීමය මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව මගින් තීරණය කරනු ලබයි. එබැවින්, ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ දී සමස්ත වගකීම, අධිකාරිය සහ පසුවිපරම් කිරීමේ හා ඇගයීමේ ක්‍රියාරාමුවට අදළ ප්‍රධාන අංග ඇතුළත් ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයේ පුළුල් සැකැස්ම හඳුනාගෙන ඇති අතර අනෙකුත් කාර්යන්හි වගකීම ජාතික වායු සමගාමට පැවරේ. මෙම ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය යථා කාලයේ දී ක්‍රියාවට නැංවීමේදී එක් එක් ප්‍රතිපත්ති තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය වන සවිස්තරාත්මක උපාය මාර්ග ඒවාට අදාළ විශේෂිත ක්‍රියාකාරකම් සමඟ අදළ පාර්ශවකරුවන් විසින් හඳුනාගනු ලබයි. ප්‍රතිපත්ති ප්‍රකාශයේ 4.1.5.9 වගන්තියේ යෝජනාකර ඇති වායු උපයෝජන ප්‍රධාන සැලැස්ම මගින් ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා බහු පාර්ශවකරුවන්ගේ උත්සාහයන් ඒකාබද්ධ කිරීම සඳහා වන ක්‍රම සපයනු ලබයි.

**6.1 ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය**

පවත්නා සීමාසහිත ධාරිතාවක් තුළ ස්වභාවික වායු කර්මාන්තයක් හඳුන්වා දීමේ දී ඇතිවන අභියෝග සහ අගයදාමයේ පවතින සංකීර්ණතාවය හේතුවෙන් අදියරගත ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයක් අනුගමනය කිරීමට රජය අදහස් කරයි. මෙම ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය පහත සඳහන් ප්‍රධාන පියවරවලින් සමන්විත වේ :

- **මූලික සම්බන්ධීකරණය හා සහයෝගීතාවය වර්ධනය කිරීමේ මිණුම්දඬු** : මෙහි දී අන්තර් නියෝජිතායතන අතර සන්නිවේදනය ආරම්භ කිරීම, නියෝජිතායතන මට්ටමින් සම්බන්ධීකරණ නිලධාරීන් නම් කිරීම, බහු නියෝජිතායතන සම්බන්ධීකරණ කමිටු පත් කිරීම, දනට පවතින නියෝජිතායතනවල විශේෂිත වූ කාර්යභාරය හා වගකීම් හඳුනාගැනීම සහ ක්‍රියාකාරකම් සමලෝචනය කිරීම, තොග ගණනය සහ මූලික සැලසුම්කරණය යනාදී වූ, අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන අත්‍යාවශ්‍ය සම්බන්ධීකරණ ක්‍රියාකාරකම් අන්තර්ගත වේ.

- **පවතින නීතිමය හා ආයතනික ක්‍රියා රාමුව තුළ ශක්‍යතාවයෙන් යුත් මැදිහත්වීම** : මූලික අදියරේ දී ගොඩනගනු ලබන සම්බන්ධීකරණ යාන්ත්‍රණය භාවිතා කිරීම, පවතින නෛතික හා ආයතනික ක්‍රියාරාමුව තුළ සිදුකළ හැකි මැදිහත් වීම් පාර්ශවකරුවන් විසින් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- **නෛතිකමය, ආයතනික හා නියාමනය ක්‍රියාරාමුව තුළ ව්‍යුහාත්මක වෙනස්කම් අන්තර්ගත කිරීම** : පවතින ක්‍රියාරාමුව තුළ සිදුකළ හැකි මැදහත්වීම් ක්‍රියාත්මක කරන අතරතුර අනෙකුත් ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික, ආයතනික සහ නියාමන ක්‍රියා රාමුව තුළ සිදුකළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් අදළ පාර්ශවකරුවන් විසින් හඳුනාගනු ලැබේ.

- **වායු උපයෝජන ප්‍රධාන සැලසුම සැකසීම හා දියත් කිරීම** : පාර්ශවකරුවන්ගෙන් උපදෙස් ලබා ගැනීම, වසර පහක සැලසුම් කාලය තුළ පරමාර්ථ හා ඉලක්ක හඳුනා ගැනීම, විශේෂ උපාය මාර්ග හා ක්‍රියාකාරකම් කාලරාමුව සහිතව ඇතුළත් කරමින් වායු උපයෝජන ප්‍රධාන සැලසුම සකස් කිරීම, ක්‍රියාකාරකම් සඳහා වගකිවයුතු ආයතන හඳුනාගැනීම, පසු විපරම් හා ඇගයීමේ ක්‍රියා රාමුව සැකසීම, හා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් නියම කරන ලද කාල පරාසය තුළ දියත් කිරීම මෙහි අන්තර්ගත වේ.

ක්‍රියාවට නැංවීමේ උපාය මාර්ග සඳහා වූ තාවකාලික කාලසටහන

| *ක්‍රියාවට නැංවීමේ පියවර* | *තාවකාලික කාලසටහන* |
|---|---|
| මූලික සම්බන්ධීකරණ හා සහයෝගීතා ගොඩනැංවීමේ මිණුම්දඬු | මෙම ප්‍රතිපත්තිය සඳහා අමත්‍ය මණ්ඩල අනුමැතියෙන් මාස 3ක් ඇතුළත |
| පවතින නෛතික හා ආයතනික ක්‍රියාරාමුව තුළ ප්‍රායෝගික මැදිහත්වීම | මෙම ප්‍රතිපත්තිය සඳහා අමත්‍ය මණ්ඩල අනුමැතියෙන් මාස 8ක් ඇතුළත |
| වායු උපයෝජන ප්‍රධාන සැලසුම සැකසීම හා දියත් කිරීම | මෙම ප්‍රතිපත්තිය සඳහා අමත්‍ය මණ්ඩල අනුමැතියෙන් මාස 18ක් ඇතුළත |
| නෛතික, ආයතනික හා නියාමයනය කිරීමේ ක්‍රියාරාමුව තුළ ව්‍යුහාත්මක වෙනස්කම් අන්තර්ගත කිරීම | මෙම ප්‍රතිපත්තිය සඳහා වූ අමත්‍ය මණ්ඩල අනුමැතියෙන් වසරක් ඇතුළත |

**6.2 වගකීම හා අධිකාරිය**

ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වගකීම අමාත්‍යාංශය සතුවේ. ස්වභාවික වායු දූරිය හැකි මිළකට විභවීය පාරිභෝගිකයන් වෙත ලබාදීමට හැකිවන පරිදි අදළ පරදුකරුවන් හා ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් ස්වභාවික වායු ගවේෂණය කිරීමේ, ආනයනය කිරීමේ, ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ තීරණ ගැනීමේ වගකීම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. අමාත්‍යාංශය විසින් ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කළමනාකරණ හා සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කරමින් එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ නායකත්වය ගනු ඇත.

මෙම කාර්යයේ දී, අදළ ප්‍රතිපත්තිමය මැදිහත්කරණ ක්ෂේත්‍රය මත පදනම්ව අමාත්‍යාංශය වෙත සිය විෂය පථය යටතේ එන රේඛීය නියෝජිතායතන මෙන්ම වෙනත් අමාත්‍යාංශ හා රේඛීය නියෝජිතායතනයන්හි සහාය ද ලැබෙනු ඇත.ස්වභාවික වායු පිළිබඳ දේශීය සම්පත් වාණිජමය වශයෙන් සංවර්ධනය කිරීමේ කාර්යය වෙත අවධානය යොමුකර ඇති ප්‍රතිපත්ති මැදිහත්කරණයන් ක්‍රියාත්මක කිරීමෙහිලා අමාත්‍යාංශය වෙත සෘජු ලෙස ම ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ සාහය ලැබෙනු ඇත. හිමකම් මාරු කිරීම දක්වා දේශීය මූලාශ්‍රයන් වෙතින් ස්වභාවික වායු ගවේෂණය කොට ප්‍රයෝජනයට ගැනීමේ කටයුතු නියාමනය කිරීමේ වගකීම ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය වෙත පැවරී ඇත. මෙරටට ඛනිජතෙල් ආනයනය කොට රට තුළ බෙදහැරීමට අදළ අවසරපත්‍රයක් සහිත ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වැනි දනට පවත්නා නියෝජිතායතන සතුව පවත්නා ප්‍රවීනත්වය හා තාක්ෂණික දනුම ද අමාත්‍යාංශය විසින් ප්‍රයෝජනයට ගනු ඇත.

4.1.5 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි යෝජිත ප්‍රතිපත්ති මැදිහත්කරණයන් ක්‍රියාත්මක කිරීමේ නව ආයතනික ක්‍රියාරාමු ස්ථාපනයට අමාත්‍යාංශය විසින් නිසි ක්‍රියාමාර්ග ගනු ඇත. රටතුළ ස්වභාවික වායු ආශ්‍රිත රජයේ ආර්ථික ගනුදෙනු සම්බන්ධීකරණය පිණිස, අමාත්‍යාංශය විසින් අවශ්‍ය බලතල, සම්පත් හා මෙහෙයුම් ස්වාධීනත්වය සහිතව 4.1.5.6 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ යෝජිත පරිදි ජාතික වායු සමාගම පිහිටුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. 4.1.5.2 හා 4.1.5.3 ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හි යෝජිත පරිදි, මෙකී ආයතනික වැඩපිළිවෙලයන් මනා ලෙස ක්‍රියාත්මක කරවීම සඳහා සුදුසු නෛතික විධිවිධාන හා නියාමන යාන්ත්‍රණ හඳුන්වාදීම ද අවශ්‍ය කෙරෙනු ඇත. විවිධ ප්‍රතිපත්ති ප්‍රකාශනයන් විසින් පෙන්වා ඇති පරිදි, ක්‍රියාත්මකවීමේ ප්‍රධාන වගකීම් සමඟ අදළ ආයතන පහත සඳහන් පරිදි වේ.

| *නියෝජිතායතනය* | *ප්‍රධාන කාර්යභාරය/වගකීම* |
|---|---|
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන විෂය පථයට අදළ අමාත්‍යාංශය | ප්‍රතිපත්ති විධාන, මාර්ගෝපදේශනය, අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය හා ජාතික ස්වභාවික වායු ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ ලා සමස්ත අධීක්ෂණය |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය | ස්වභාවික වායු කර්මාන්තයේ පෙරභාග කාර්යයන් නියාමනය කිරීම |
| ජාතික වායු සමාගම (ජාතික ස්වභාවික වායු ප්‍රතිපත්තියේ යෝජිත පරිදි) | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව (PPP) ව්‍යාපාරය ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන නෛතික හා ආයතනික සහාය ඇතුළුව ස්වභාවික වායු සම්බන්ධ රජයේ සියළුම ආර්ථික කටයුතු හැසිරවීමට හැකි විශේෂ ආයතනය |
| ශ්‍රී ලංකාවේ මහජන උපයෝගීතා කොමිෂන් සභාව | මධ්‍ය හා පසුගාමී වායු වෙළෙඳපොළ නියාමනය කිරීම. |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ජාතික ස්වභාවික වායු ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය තාක්ෂණික හා ආයතනික සහය ලබාදීම |

ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ පරමාර්ථ හා අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නියාමන ආයතන සමඟ එක්ව කටයුතු කිරීමට අමාත්‍යාංශයට සිදුවේ. ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව, මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යනාදී, මධ්‍යම රාජ්‍ය ආයතන ඊට ඇතුළත් වේ. අවශ්‍ය අවස්ථාවල දී මෙම ආයතනවල සහයෝගය ලබා ගැනීම සඳහා අන්තර් අමාත්‍යාංශ ක්‍රියාකාරී කණ්ඩායම් පත් කිරීම වැනි සුදුසු සම්බන්ධීකරණ යාන්ත්‍රණ අමාත්‍යාංශය විසින් ඇති කරනු ඇත.

පළාත් පාලන ආයතන වැනි උප ජාතික ආයතනවල සහයෝගය ලබා ගැනීමට අවශ්‍ය මැදිහත් වීම් ද ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය තුළ අන්තර්ගත වේ. ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී උප ජාතික ආයතනවල සහයෝගය ලබා ගැනීම සම්බන්ධීකරණයට අවශ්‍ය ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විසින් ගනු ඇත.

ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාවට නැංවීමේ දී ජාතික හා උප ජාතික රාජ්‍ය ආයතනවල සහයෝගයට අමතරව පෞද්ගලික අංශය හා රාජ්‍ය නොවන ආයතනවල ඉතා කිට්ටු සංයෝගය හා සම්බන්ධීකරණය ද අත්‍යවශ්‍ය වේ. ප්‍රතිපත්ති මූලධර්ම 3.5 හා ප්‍රතිපත්ති ප්‍රකාශන 4.1.5.6 ප්‍රකාරව යෝජනා කර ඇති පරිදි රාජ්‍ය නොවන ආයතන ඵලදායීව සහභාගී වීමේ පදනම මගින් ශක්තිමත් නියාමන ක්‍රියා රාමුවක් ගොඩනැගීම සිදු වේ. ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛ කාර්යයක් වශයෙන් සිදු කිරීම ස්වභාවික වායු කර්මාන්තය පාලනය කිරීම සඳහා නියාමන යාන්ත්‍රණයක් ඇති කිරීම සඳහා අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගනු ලබයි.

**6.3 පසුවිපරම් කිරීම හා ඇගයුම් කිරීම**

යෝජිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා අමාත්‍යාංශය විසින් පහත සඳහන් ප්‍රධාන මූලිකාංග ද සහිත මනාසේ අර්ථ නිරූපිත පසුවිපරම් හා ඇගයීම ක්‍රියා රාමුවක් හඳුන්වාදෙනු ඇත :

- ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා වායු උපයෝජන ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සෑම පාර්ශ්ව නියෝජිතායතනයකම නිශ්චිත කාර්යභාරයන් හා වගකීම් සහිතව සංවිධාන ව්‍යුහය ස්ථාපනය කිරීම,
- නිසි පරිදි අර්ථ නිරූපිත කාල රාමුවක් සමඟින් ඒ ඒ නියෝජිතායතනය සඳහා කාර්යයන් හඳුනා ගැනීම,
- මූලික දත්ත රැස් කිරීමේ ක්‍රියා පිළිවෙල හා කර්ය පරිපාටිය ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණ ක්‍රියා සහ ප්‍රගතිය වාර්තා කිරීම.
- මිනුම් සලකුණු අර්ථකථනය, අභිමතාර්ථ හා ඉලක්ක මැනීම, සෑම පාර්ශවකරුවෙක් සඳහාම ප්‍රධාන කාර්ය සාධන දර්ශක ස්ථාපනය කිරීම යනාදී වශයෙන් දර්ශක සැකසීම.
- කලින් කලට සිදුකරන ඇගයීම සඳහා අවශ්‍ය කාල රාමුව සැකසීම.
- පසු විපරම් හා ඇගයුම්කරණ කාර්යයන් සිදු කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම.

කාලීනව සිදු කළයුතු නිවැරදි කිරීමේ සහ ප්‍රතිපත්තිමය අන්තර්ගතයන් හි ඵලදායීතාව, කාර්යක්ෂමතාව, තිරසාරබව හා ඒවායෙහි බලපෑම තක්සේරු කිරීම, පසුවිපරම් කිරීමේ හා ඇගයීම් ක්‍රියාරාමුව තුළින් සිදුකරයි. පසු විපරම් කිරීම හා ඇගයීම් ක්‍රියාරාමුව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම් හා වැඩි දියුණු කිරීම් 4.1.8.5 ප්‍රතිපත්ති ප්‍රකාශයේ පරිදි යෝජිත තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් ස්වභාවික වායු තොරතුරු පද්ධතියක් මගින් සිදුකරනු ඇත.

### වාග්මාලාව

| | |
|---|---|
| ෆොසිල ඉන්ධන | ඛනිජතෙල්, ගල් අඟුරු හෝ ස්වභාවික වායු වශයෙන් පෘථිවි ගර්භයේ ස්වභාවිකව ඇතිවන කාබනික ඉන්ධන |
| හයිඩ්‍රොකාබන් වර්ග | හයිඩ්‍රජන් හා කාබන්වලින් සමන්විත කාබනික සංයුතියකි. හයිඩ්‍රොකාබන් වායු, ද්‍රව හෝ ඝන ස්වරූපයන්ගෙන් පැවතිය හැකිය. |
| ඛනිජ තෙල් | බොරතෙල්, ස්වභාවික වායු හා ඒවාහි නිෂ්පාදන ඇතුළත් වන්නාවූ හයිඩ්‍රොකාබන් සඳහා වූ පොදු නාමයකි. |
| තෙල් ස්වරූපයේ ඛනිජ තෙල් | ස්වභාවිකව ඇතිවන බොරතෙල් පිරිපහදු කිරීමේ ක්‍රියාවලියේ නිමැවුම් වශයෙන් ලැබෙන විවිධ අණුමය ස්කන්ධයන් සහිත ද්‍රවීකෘත හයිඩ්‍රොකාබන් වර්ග වේ. පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් හා දැවි තෙල් උදාහරණ වේ. |
| ස්වභාවික වායු | සංචිත තත්ත්වයන්හි ස්වභාවික භූගත සංචිතයන්හි බොර ඛනිජතෙල් ආශ්‍රිතව වායුමය අදියරේ දී හමුවන ස්වභාවික හයිඩ්‍රෝකාබන් සංයුතිමය මිශ්‍රණයකි. ස්වභාවික වායුවල සාමාන්‍යයෙන් අන්තර්ගත ප්‍රධාන හයිඩ්‍රොකාබන් වර්ග වනුයේ මීතෙන්, ඊතේන්, ප්‍රොපේන්, බියුටේන් හා පෙන්ටේන් ය. ස්වභාවික වායු කාබන් ඩයොක්සයිඩ්, හීලියම්, හයිඩ්‍රජන් සල්ෆයිඩ් හා නයිට්‍රජන් බඳු හයිඩ්‍රොකාබන් නොවන ද්‍රව්‍ය සුළු ප්‍රමාණයෙන් ආශ්‍රිතව ද පැවතිය හැකිය. |
| ජීව වායු | ජීව වායු, පුනර්ජනනීය ස්වාභාවික වායු හෝ තිරසාර ස්වභාවික වායු ලෙස ද හඳුන්වන අතර මෙය නිස්සාරණය කරනු ලබන්නේ 90%කට වඩා වැඩි මීතෙන් ප්‍රතිශතයක් අන්තර්ගත පොසිල ස්වභාවික වායුවල තත්ත්වයට සමාන තත්ත්වයකට උසස්කරන ලද ජෛව ස්කන්ධ මගිනි. |
| ද්‍රවිකෘත ස්වභාවික වායු (LNG) | ගබඩා කිරීමට හා ප්‍රවාහනයට වඩා පහසු හා අඩු අවදනම්කාරී වනු පිණිස ද්‍රව ස්වරූපයට හැරෙන තෙක් අතිශයින් අඩු උෂ්ණත්ව මට්ටම් (සෙල්සියස් අංශක සෘණ 160ට අඩු අගයක්) දක්වා ශීතකළ ස්වභාවික වායු, එම කාර්යය ද්‍රාව්‍යකරණ යන්ත්‍රාගාරයන්හි ද්‍රාව්‍යකරණය නමින් හැඳින්වෙන ක්‍රියාවලියක් මගින් සිදු කෙරේ. |
| සංපීඩිත ස්වභාවික වායු (CNG) | ප්‍රධාන වශයෙන් වාහන ධාවනයේ දී විකල්ප ද්‍රාව්‍ය ඉන්ධනයන් ලෙස භාවිත කරනු පිණිස සිලින්ඩර/ටැංකි සඳහා ලබාගන්නා සම්පීඩිත පුනර්ජනනීය ස්වභාවික වායු ධාරිතාවය අවම කිරීමේ යාන්ත්‍රණය වශයෙන් සංපීඩිත ස්වභාවික වායු රඳා පවත්නේ පීඩනය යෙදීම මතය. |
| ද්‍රවීකෘත ඛනිජතෙල් වායු (LPG) | සාමාන්‍ය උෂ්ණත්වයන්හි දී පීඩනය යෙදීමෙන් ද්‍රාව්‍ය මට්ටමේ පවත්වාගෙන යනු ලබන හා, ගබඩා කිරීම, ප්‍රවාහනය හා ආශ්‍රිත කටයුතු කිරීමේ පහසුව සඳහා පීඩනය යොදනු ලබන සැහැල්ලු හයිඩ්‍රෝකාබන්, වාණිජමය ද්‍රාව්‍යකරණය කළ ඛනිජතෙල් වායු ප්‍රධාන වශයෙන් ප්‍රොපේන් හෝ බුටේන් හෝ ඒවාහි සංයුතියකින් සමන්විත වේ. |
| අමුද්‍රව්‍ය වායු | ඛනිජ රසායනයන් හා සෙසු කාර්මික නිෂ්පාදන නිමැවීම ද ඇතුළත්ව කාර්මික ක්‍රියාවලීන් සඳහා අමුද්‍රව්‍ය වශයෙන් භාවිතා කෙරෙන වියළි වායු. |
| ද්‍රාව්‍යකරණය | ස්වභාවික වායු ද්‍රවීකෘත ස්වභාවික වායු බවට පරිවර්තනය කරන්නාවූ ක්‍රියාවලියයි. ශීතකාරකයක් භාවිතයෙන් පුළුල් උෂ්ණත්ව පරාසයකට ඉහළින් පවත්නා අභ්‍යන්තර තාපය ඉවත් කිරීම ඒ සඳහා අවශ්‍ය වේ. |
| සම්පීඩනය | සම්පීඩිත ස්වභාවික වායු නිෂ්පාදනය කෙරෙන ආකාරයෙන් යම් වායු ධාරිතාවයක් වඩා කුඩා ඉඩ හසරක් තුළට සංකෝචනය කිරීමේ ක්‍රියාවලියයි. |

| | |
|---|---|
| ප්‍රති-වායුකරණය | වායු නළ මාර්ග පද්ධතියකට යොමු කළ හැකිවන පරිදි තාපය යොදමින් ද්‍රාව්‍යකරණය කළ ස්වභාවික වායු එහි වායු ස්වරූපයට හැරවීමේ ක්‍රියාවලියයි. |
| පෙරගාමී වායු කර්මාන්තය | නළ මාර්ගයනට ඇතුළු කිරීමේ හෝ නැව්ගත කිරීමේ අවස්ථාව දක්වා වායු කර්මාන්තයේ ගවේෂණ හා නිෂ්පාදන කාර්යයන් විස්තර කිරීම සඳහා සාමාන්‍යයෙන් භාවිත කෙරෙන යෙදුමයි. |
| පසුගාමී වායු කර්මාන්තය | ස්වභාවික වායු අලෙවිය හා බෙදහැරීම් ද ඇතුළත් අවසන් පාරිභෝගිකයා වෙත වඩාත් සමීප වාණිජ වායු මෙහෙයුම් |
| මධ්‍ය වායු කර්මාන්තය | අමු ස්වභාවික වායු පිරිසැකසුම්කරණ පහසුකමක් දක්වා නළ මාර්ග ප්‍රවාහනය බොහෝ දුරට ඇතුළත් කෙරෙන වායු සැපයුම දමයේ පෙරගාමී හා පසුගාමී අංශ අතර පවත්නා කාර්යයන් |
| ගබඩාකරණය | ටැංකිවල වායු ගබඩා කිරීමෙන් කලින් කලට ඇතිවන ඉල්ලුම් සපුරාලීම සඳහා ස්වභාවික වායු සැපයුම් සංචිතයක් පවත්වාගැනීම. |
| නළ මාර්ගය | වායු වෙන් කිරීම, මිනුම්ගත කිරීම, ඒකරාශී කිරීම, ප්‍රවාහනය හා බෙද හැරීම සඳහා අවශ්‍ය නළ මාර්ග පිරිසිදු කිරීමේ වැල්ව හා/හෝ පිග් බැරල් වැනි වායු ස්ථානයන්හි ස්ථානගත කර ඇති වෙනත් පහසුකම් ඇතුළත්ව අක් වෙරළ හෝ වෙරළබඩ ස්ථාන දෙකක් අතර ස්වභාවික වායු ප්‍රවාහනය සඳහා සැකසුණු නළ - පදනම් ගත පද්ධතියයි. |
| මිළ දර්ශකකරණය | කොන්ත්‍රාත් මිළක් (සාමාන්‍යයෙන් සංකීර්ණත්වයෙන් අඩු) වෙනත් නිෂ්පාදනයක මිළට සම්බන්ධ කරන්නා වූ ක්‍රියා පරිපාටිය හෝ වෙනත් සාධකයකට අනුව දෙවනු ඇතිවන මිල විචලනය වීමට අවකාශ සලසන ආර්ථික දර්ශකයයි. වායු කොන්ත්‍රාත් මිළ ගණන් බොහෝ විට ප්‍රධාන බොරතෙල් දර්ශක, ඇතැම් ඉන්ධන තෙල් මිළ ගණන්, හෝ, ඇතැම් අවස්ථාවන්හි බලශක්ති හෝ ආර්ථික වර්ධන දර්ශකවලට සම්බන්ධ වේ. |
| ස්ථානීය මිළ | ස්වභාවික වායු කෙටි කාලීන විකුණුම් - මිළට ගැණුම් කාර්යයේ දී ලබාදෙන මිළයි. |
| වර්ගීකරණ ආයතනය | පරීක්ෂා කිරීම් සඳහා කටයුතු සලසන හා (වායු ප්‍රවාහනය කරන යාත්‍රා ඇතුළත් ) නැව්වල තත්ත්වය පිළිබඳ උපදෙස් ලබාදෙන, යාත්‍රා ඉදිකිරීමේ කාර්යය ඇතුළත හා ඉන් පසුව ඒවා මුහුදු ගමන් සඳහා යෝග්‍ය වන්නේ ද යන්න තක්සේරු කරනු පිණිස අධීක්ෂණය කරන, යාත්‍රාවන් සඳහා ශ්‍රේණි හෝ පන්ති ලබාදෙන පුද්ගලික සංවිධානයයි. ප්‍රධාන වර්ගීකරණ ආයතන විසින් සිය |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.